# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

45 වන කලාපය
2023 ජනවාරි - මාර්තු

# RANAWARUNA



## විරුදරු ප්‍රණාම
## මූල්‍යාධාර ප්‍රදානෝත්සවය

දැයේ දුවා දරුවන්ට
නිදහසේ
අකුරු කරන්නට
රටක්
ඉතිරි කළ
විරුවනි ...
ඔබ නමින් ජනිත
දස්කම් පෑ
දූ දරුවන්ට
සෙනෙහසිනි ...







# විරුදරුවන් ශිෂ්‍යත්වලාභීන් වූ වගයි ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සාමාජිකයන් වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සුබසාධන වැඩසටහන් අතරින් ප්‍රමුඛතම වැඩසටහනක් වන විරුදරු ප්‍රණාම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2019 හා 2020 වර්ෂවලදී විශ්වවිද්‍යාල වරම් ලබා ඇති දූ දරුවන් වෙත අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහන පසුගිය මාර්තු මස 23 වන දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ජ්‍යේෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.

මේ සඳහා වර්තමානයේ සේවයේ යෙදී සිටින, සේවයේ යෙදී සිටිය දී සේවයට අදාළව මියගිය හා ක්‍රියාන්විත හේතූන් මත මියගිය ස්වේච්ඡා සාමාජික සාමාජිකාවන්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ දූ දරුවන් 46 දෙනෙකු වෙත රුපියල් මිලියන 03 කට අධික මූල්‍යමය පරිත්‍යාගයක් මෙහිදී ප්‍රදානය කරන ලදි.







මේ අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, රක්ෂණ සංස්ථාවේ කළමනාකාර මහත්වරුන්, ශිෂ්‍යත්වලාභී දූ දරුවන්, දෙමාපියන් මෙන්ම සෙසුනිල සාමාජිකයන් පිරිසක්ද සහභාගී වූහ.

## රණවිරුණ කාර්ය මණ්ඩලය

### අධීක්ෂණය



**මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP**

### උපදේශකත්වය



**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව් ජී පී සිසිර කුමාර RSP**



**කර්නල්**
**එච් එච් එස් පී එස් ද සිල්වා RSP USP**

### සංස්කාරක



**ලුතිනන් කර්නල්**
**එන් ඩබ්ලිව් දහනායක ශ්‍රීලංජාආබමු**

**සහය සංස්කාරක/සෝදුපත් කියවීම**
මේජර් ඩී එම් දිල්හාරා සජිවනී ජාශිබ

මා/සැ ජයතිලක එම්ඒ (සම්බන්ධීකරණය)
කෝප්‍රල් කීර්තිරත්න ඒචච්ටීචස්චස් (පරිගණක නිමැවුම්)
කෝප්‍රල් ධර්ම ශ්‍රී වයිඒචස් (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් ලහිරු ඩීචම්චන් (පිටු සැකසුම)
කෝප්‍රල් කරුණාතිලක ඒචම් (ඡායාරූප)
ලා/කෝප්‍රල් තෙවරප්පෙරුම අයියූ (ඡායාරූප)

### රණවරුණ ලිපිනය


**සංස්කාරක,**
**රණවරුණ**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා**
**ස්වේච්ඡා බළසේනා මූලස්ථානය**
**යුද්ධ හමුදා කඳවුර**
**සීතාවක - කොස්ගම**

**ඊමේල්** - **ranawaruna@yahoo.com**
**දුරකථන** - **036 2255 362**
**වෙබ්** - **slavf@army.lk**



**මුද්‍රණය**
**නියෝ ග්‍රැෆික්ස්**



# නවක ස්වේච්ඡා නිලධාරීන්ගේ මූලස්ථාන සංචාරය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය දියතලාව වෙතින් පුහුණුව අවසන් කර ස්වේච්ඡා ඒකක වෙත අනියුක්ත වූ නවක ස්වේච්ඡා නිලධාරීන් හා නිලධාරිණියන් 95 දෙනෙකු ස්වේච්ඡා බළසේනා මූලස්ථානය වෙත ප්‍රථම සංචාරය ජනවාරි මස 10 වන දින සිදු කරන ලදි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ගේ සංකල්පයකට අනුව නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ගේ මඟපෙන්වීම යටතේ මෙම වැඩසටහන පළමුවරට සංවිධානය කරන ලදි.

මෙම වැඩසටහනේදී ස්වේච්ඡා බළසේනාවේ අභිමානවත් ඉතිහාසය, දිගුකාලීන සම්ප්‍රදායයන් හා මූලික ක්‍රියාපටිපාටි මෙන්ම ස්වේච්ඡා බළසේනාවේ වටිනාකම පිළිබඳව මෙම නවක නිලධාරීන් දැනුවත් කරන ලදි. එමෙන්ම අවංකභාවය, භක්තිය සහ ස්ථානෝචිත ප්‍රඥාව යන ගුණාංග ත්‍රිත්වය ඔස්සේ නිලධාරියෙකුගේ අනාගත අභිවෘද්ධිය සැලසෙන ආකාරය පිළිබඳව සේනාවිධායකතුමන් සිය දේශනය තුළින් අවධාරණය කරන ලදි.

මෙම සුවිශේෂී අවස්ථාව සඳහා සේනාවිධායකතුමන් ප්‍රධාන ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී විය.





# වාර්ෂික පාලන පරීක්ෂණව සිදුකරමින් ...











ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ වාර්ෂික කාලසටහනේ එක් අංගයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ගේ උපදෙස් මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ නියෝජ්‍ය සේනාවිධායක, මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය යටතේ ස්ථාපිත ස්වේච්ඡා බළඇණිවල වාර්ෂික පාලන පරීක්ෂාව පෙබරවාරි මස 16 සහ 17 යන දෙදින තුළ පවත්වන ලදි.

පාලන පරීක්ෂාවට පෙර නියෝජ්‍ය සේනාවිධායක විසින් යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩී බී එස් එන් බෝතොට RWP RSP VSV USP psc සමඟ සුහද කතාබහක නිරත වූ අතර නියෝජ්‍ය සේනාවිධායක විසින් පෙබරවාරි මස 16 වන දින ආරක්ෂක සේනා මූලස්ථානයට (යාපනය) අයත් ස්වේච්ඡා බළඇණිවල හටපිරිස් ඇමතූ අතර එම අවස්ථාවට අදාළ අණදෙන නිලධාරීන්, ජ්‍යේෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ. ස්වේච්ඡා බළසේනා පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් ඩබ්ලිව් පී පී සිසිර කුමාර RSP, බ්‍රිගේඩියර් පාලන බ්‍රිගේඩියර් එම් ඩී බී එම් එස් ජයමාන්න ඇතුළු, ජ්‍යේෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

# බදාදා පුහුණු දිනයට සමගාමීව සිය දැණුම හා

## යහසාධක අරමුදල ...



ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ බදාදා දින පුහුණු වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යහසාධක අරමුදල පිළිබඳව දැනුවත් කිරීම ලුතිනන් කර්නල් ආර් එම් බාලසූරිය USP ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් විසින් පසුගියදා සිදුකරන ලදි.

මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් ඩබ්ලිව් පී පී සිසිර කුමාර RSP ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිල සමාජිකයින් පිරිසක්ද සහභාගී වූහ.

## යහපත් පවුල් ජීවිතයක් ගොඩනගා ගැනීම ...



ජනවාරි මස 11 වන දිනට යෙදුණු බදාදා පුහුණු දිනය වෙනුවෙන් **ආකල්ප සංවර්ධනය තුළින් යහපත් පවුල් ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා** ඉවහල් වන දේශනයක් විශ්‍රාමික ලුතිනන් කර්නල් සමන්ති බංඩාර ජාශිබ ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමිය විසින් පවත්වන ලදි.

යහපත් පවුල් ජීවිතයක වැදගත්කම ඒ සඳහා හේතු වන ආකල්ප සංවර්ධනයට අදාළ චර්යාමය වෙනසක වැදගත්කම,අවධාරණය කළ මෙම දේශනය සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිල සමාජිකයින් පිරිසක්ද සහභාගී වූහ.

## සොල්දාදුවාගේ යුතුකම් සහ වගකීම් ...



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ බදාදා පුහුණු දිනය වෙනුවෙන් ජනවාරි මස 25 වන දින ලුතිනන් කර්නල් එම් ඩී ජේ වික්‍රමආරච්චි USP psc විසින් **යුද්ධ හමුදා සාමාජිකයන්ගේ වගකීම්** පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පවත්වන ලදි.

ජාතික ඒකාග්‍රතාවයට, ස්වෛරීභාවයට තර්ජනයක් වන දේශීය සහ විදේශීය බලපෑම්වලින් ජාතිය ආරක්ෂා කිරීමේ වගකීම පිළිබඳ දේශනය තුළදී පැහැදිලි කළ අතර සොල්දාදුවා තුළ වර්ධනය කර ගත යුතු හර පද්ධතිය පිළිබඳව එහිදී පැහැදිලි කරන ලදි.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන් මෙන්ම සෙසුනිල සාමාජිකයන් පිරිසක්ද සහභාගී වූහ.

# අත්දැකීම් අප හා බෙදා හදා ගනිමින්

## රිය අනතුරු වළක්වා ගැනීම ...



පෙබරවාරි මස 08 වන බදාදා දින පුහුණු දිනය වෙනුවෙන් මාර්ග අනතුරුවලින් වැළකීම පිළිබඳ දේශනය කොස්ගම පොලිස් ස්ථානයේ රථවාහන අංශභාර නිලධාරී උප පොලිස් පරීක්ෂක ආර් ඩබ්ලිව් පී ගුණදාස රත්නායක මහතා විසින් පවත්වන ලදි. රට තුළ දිනෙන් දින ඉහළ යන මාරක රිය අනතුරු ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට විශාල බරක් බැව් පෙන්වා දුන් උප පොලිස් පරීක්ෂකතුමන් විනයගරුකව කටයුතු කිරීමෙන් මාර්ග අනතුරු වැළක්විය හැකි බව පෙන්වා දෙන ලදි.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් තුසිත සිල්වා කේඑස්පී ඇතුළු නිලධාරී සෙසුනිල පිරිසක් සහභාගී වූහ.

## සංස්කෘතිය, කලාව හා උරුමය...



පෙබරවාරි මස 23 වන දිනට යෙදුණු බදාදා දින පුහුණු දිනය වෙනුවෙන් සංස්කෘතිය, කලාව, උරුමය සහ වීරත්වය යන මැයෙන් දේශනයක් පවත්වනු ලැබුවේ පුරාවිද්‍යාව හා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ පෘථුල දැනුමක් ඇති පුරාවිද්‍යා කථිකාචාර්ය රන්දුනු විදුල සොයිසා විසිනි.

ශ්‍රී ලංකාවේ පුරාණ ගෘහ නිර්මාණ ශිල්පයෙහි ඇති විශේෂත්වය පෙන්වා දුන් විදුල සොයිසා සීගිරිය ලෝකයේ වැදගත්ම නාගරික සැලසුම්වලින් එකක් බව පෙන්වා දුන්නේය. රට එක්සේසත් කිරීමේ අරමුණින් විවිධ ක්ෂෙත්‍ර ඔස්සේ තම වීරත්වය ප්‍රදර්ශනය කළ දුටුගැමුණු රජුගේ දසමහ යෝධයන් සිහිපත් කරමින් සිය දැනුම අප හා බෙදා හදා ගන්නා ලදි. මෙම දේශනය සඳහා මූලස්ථාන ජ්‍යේෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිල සාමාජිකයන් පිරිසක් සහභාගී වූ අතර විශාලන තාක්ෂණය ඔස්සේ ස්වේච්ඡා ඒකකවල භට පිරිස්ද සහභාගී වූහ.

## ආතති කළමනාකරණය තුළින් සාර්ථක ජීවිතයකට මග...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකායට අයත් සායනික මනෝ විද්‍යාඥවරියෙකු වන කපිතාන් එස් වී ආර් ද සිල්වා නිලධාරිණිය ආතති කළමනාකරණය තුළින් සාර්ථක ජීවිතයකට මග පෑදෙන ආකාරය පහදා දෙමින් පෙබරවාරි මස 01 වන බදාදා දින දේශනය පවත්වන ලදි.

මිනිස් ජීවිතවලට විශාල ලෙස බලපාන ආතතිය කළමනාකරණය කරමින් මොළයේ බලය වටහාගෙන ජීවිතය සාර්ථකව ගොඩනංවා ගත යුතු ආකාරය පැහැදිළි කර දෙමින් ආකර්ෂණීය දේශනයක් පවත්වන ලදි. මෙම දේශනය සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ මූලික මාණ්ඩලික නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.



# අවංකභාවයට හරසර පුදකරමින්





5 වන ස්වේච්ඡා ගජබා රෙජිමේන්තුවට අයත් ලාන්ස් කෝප්‍රල් ධීරසිංහ පීකේඩීඑස් යන කොනොනි 2023 ජනවාරි මස 11 වන දින හොරොව්පතාන මහජන බැංකු සීඩීඑම්ඒ යන්ත්‍රය මගින් මුදල් තැන්පත් කිරීමට යාමේදී එහි අතපසුවී තිබුණු රු.70400.00ක මුදල අයිතිකරු වන, හොරොව්පතාන ප්‍රදේශයේ පදිංචි මොහොමඩ් මසව්ෆර් හට බාරදෙන ලදි. මෙම අවස්ථාව සඳහා ඒකක අණදෙන නිලධාරී මේජර් ධම්මික හේරත් සහ බැංකු කළමනාකරු ඇතුළු පිරිසක් සහභාගී වුහ.

මෙම සත්ක්‍රියාව ඇගයීමට ලක්කරමින් ලාන්ස් කෝප්‍රල් ධීරසිංහ පීකේඩීඑස් වෙත ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් විසින් ඇගයීම් සහතිකයක් ප්‍රදානය කිරීම මාර්තු මස 08 වන දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායක කර්යාලයේදී සිදුකරන ලදි.

## ප්‍රජා සත්කාර වැඩසටහන ...



75 වන ජාතික නිදහස් දිනය නිමිත්තෙන් **සර්වෝදය සුවසෙත දරු සෙවණ බාලිකා නිවාසය** අවට පිරිසිදු කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම පෙබරවාරි මස 13 වන දින ස්වේච්ඡා බළසේනා මුලස්ථාන සාමාජිකයින් විසින් සිදුකරන ලදි. මෙම ප්‍රජා සත්කාරක වැඩසටහන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ගේ මඟපෙන්වීම මත නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කරන ලදි. එම අවස්ථාව අප කැමරා කාචයේ මෙසේ සනිටුහන් විය.





# විශිෂ්ට සේවා විභූෂණයෙන් පිදුම් ලැබ ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක හා ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu වෙත ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බළසේනා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස සදාචාරාත්මක හා නොකැළැල් යුදමය හැසිරීම් ප්‍රකට කරමින් ජාතිය වෙනුවෙන් ඉටුකරන ලද සුවිශේෂී, කීර්තිමත් මෙන්ම පක්ෂපාතී නොකැළැල් සේවාව අගයමින් විශිෂ්ට සේවා විභූෂණ (VSV) පදක්කම පෙබරවාරි මස 01 වන දින ත්‍රිවිධ හමුදා සේනාධිනායක ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් අතින් මහනුවර ජනාධිපති මන්දිරයේදී පිරිනමන ලදි.

මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් VSV පදක්කම ලැබීමට පෙර සතුරාට මුහුණ දීමේදී තනි පුද්ගල නිර්භීත ක්‍රියාවන් සහ කීර්තිමත් හැසිරීම වෙනුවෙන් ඔහුට රණශූර පදක්කම (RSP) පිරිනමා ඇත. තවද වසර 15 ක අඛණ්ඩ හා නොකැලැල් සේවා කාලය තුළ කුසලතාව හා ආදර්ශමත් සුවිශේෂී හැසිරීම වෙනුවෙන් උත්තම සේවා පදක්කම (USP) ද පිරිනමා ඇත. එපමණක් නොව නැගෙනහිර මානුෂීය පදක්කම, උතුරු මානුෂීය පදක්කම, පූර්ණ භූමි පදක්කම, රිවිරැස මෙහෙයුම් පදක්කම, 50 වන නිදහස් සංවත්සර පදක්කම, යුද්ධ හමුදා 50 වන සංවත්සර පදක්කම, දීර්ඝ සේවා පදක්කම, සේවාභිමානි පදක්කම සහ සේවා පදක්කම් ඇතුළු පදක්කම් රාශියකින් මෙතුමන් පිදුම් ලබා ඇත.

විශිෂ්ට සේවා විභූෂණ පදක්කම පිරිනැමීමේ ප්‍රදානෝත්සවය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ගරු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක සාගල රත්නායක, ජනාධිපති ලේකම් ඊඑම්එස්බී ඒකනායක, ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් වික්‍රම් ලියනගේ, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා, ගුවන් හමුදාධිපති එයාර්මාෂල් සුදර්ශන පතිරණ සහ විශ්‍රාමික මෙන්ම සේවයේ නියුතු ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සිය පවුල්වල සාමාජිකයින් ඇතුළු පිරිසක් මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.





# අන්තර් ශාඛා සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 142 වන සංවත්සරය නිමිත්තෙන් වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදි. ඒ අතර ස්වේච්ඡා බළසේනා මූලස්ථාන අංශ ආයතන අතර සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදි. සති ගණනක් පුරා පැවති සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියේ අවසන් මහා තරඟය මාර්තු මස 29 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ ප්‍රධානත්වයෙන් මූලස්ථාන ක්‍රීඩාංගනයේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදි.

මූලස්ථානයේ රාජකාරී නියතු නිලධාරි සහ සෙසුනිලයින්ගේ රාජකාරී මානසිකත්වයෙන් අත්මිදී කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම සහ සුහදතාව වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් පිළිමලුන් පිටු දැකීමේ ක්‍රමයට අනුව සංවිධානය කළ මෙම ක්‍රිකට් තරඟාවලිය ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ අධීක්ෂණය යටතේ කණ්ඩායම් **නමයකගේ** සහභාගීත්වයෙන් පවත්වන ලදි. මූලස්ථාන කඳවුරේ රාජකාරි කරන නිලධාරිණියන් හා කාන්තා සෙබළියන්ගේ සහභාගීත්වයෙන් ප්‍රදර්ශනාත්මක තරඟයක් පැවැත්වීමද විශේෂ කරුණකි.

උද්යෝගයෙන් පිරුණු අවසන් මහා තරඟයක් දැක බලා ගැනීමට අවස්ථාව සලසා දෙමින් කණ්ඩායම් දෙක අතර පැවති තියුණු තරඟයකින් පසුව මූලස්ථාන කණ්ඩායමට එරෙහිව තරඟාවලිය ජයගැනීමට ප්‍රධාන ශාඛා කණ්ඩායම සමත් විය. එය අප කැමරා කාචයේ මෙසේ සනිටුහන් විය.



**දක්ෂතම පිතිකාරිණිය බී කණ්ඩායම**
**කාසෙ දිසානයක ඩීඑම්එම්එම්**



**කාන්තා තරඟයේ ජය**
**කාන්තා බී කණ්ඩායම**



තරඟාවලියේ වීරයා
ලා/කෝ රණසිංහ ආර්ඒපීඑස්



අවසාන මහා තරඟයේ වීරයා
ලා/කෝ චතුරංග එස්පීඩී



අවසන් මහා තරඟයේ වැඩිම ලකුණු
ලබාගත් පිතිකරුවා කෝප්‍රල් ජයසූරිය ඒඒ



තරඟාවලියේ අනුශූරතාව
මූලස්ථාන බළඇණිය



තරඟාවලියේ සමස්ත ශූරතාව
ප්‍රධාන ශාඛාව



# නිර්මාණ අසපුව ...

## නුඹ

නුඹත් හරියට මං වාගේමයි
ජීවිත ගමනේ මට හමුවුණ
දහසක් කම් කටොළු මැද
ගෙවන මේ ජීවිතයට
සරසවිය විය..........

නොමැකෙන මතක අතරේ
ගෙවුනත් ඒ සොඳුරු අතීතය
තාමත් ඒ වගේමයි

සෙ/00815 කෝප්‍රල් චතුර කුමාර පීපීඑන්
මූලස්ථානය
2(සේවි) ශ්‍රීලයුවෙබ

## සඟවා ගනිම් ආදරේ

*දැනෙන නොදැනෙන සන්තකේ නැති*
*නුබේ පෙම සිහිකර නිති*
*ලියන පැලෙන කවිය අතරේම*
*මගේ හිතත් මම සඟවම්*

*හුස්ම නොරැදෙන දිවි කෙලවරේ වුව*
*කවි ලියා අවසන් නැති*
*නොලී කවි ඇත තව හිතේ රැන්දුව*
*ලියා අවසන් නොකරම්*

*ආදරේ බව නොකියම්*
*කවිය අතරේම සැඟවෙම්*

සෙ/එච්102385 පාසෙ සෙනෙවිරත්න
අයිඑම්පීඑන්
මූලස්ථානය
3(සේවි) විපාරෙ

## කවි සිත්තම්

**මේ වන තුරා**
**ආ ජීවන ගමන**
**නිමවන දවස හැරයම්**
**යළි නොම දකින්න**
**එනමුත් මහද පතුලේ**
**යළිදු මැවී පෙනී**
**සුසුමක් නැගෙයි**
**සිහිව දරුසිඟිත්තන්**

**දරුපෙම මිසක**
**මගෙ හද තුළ රැඳුන**
**අතහැර යන්න නොහැකි**
**කිසිවක් නැත මට**
**අවැසි වුවත්**
**කෙටි කරන්නට මේ සසර**
**දරුවනි නුඹමයි**
**මා සසරට බඳින හුය**

සෙ/එච්102734 පාසෙ බංඩාර ඩීකේපීඑම්
මූලස්ථානය
3(සේවි) විපාරෙ

## වෙනසක මහිමය

නිල් ගොයම වෙල් එළිය නියර වට    කැරකිලා
ඇවිදගිය කාලයේ මතක සැමරුම්    වෙලා
ඇළදොලේ වක්කඩේ තිත්තයින්    වියැකිලා
සරුංගල් ඉගිල ගොස් ඇත නූල්    පැටළිලා

රතු පාට ගුරු පාර කොන්ක්‍රීට්    තවරලා
කහපාට සමනල්ලු බෝ දුරක    ඉගිළිලා
කොළපාට වන ලැහැබ එළි පෙහෙලි    කර තලා
නිල් පාට අහස් උස මාලිගා    ඉදිවෙලා

බලි තොවිල් යක් නැටුම් දැන් ගමෙන් විසි    වෙලා
අලි ඇතුන් කොට ඇද්ද තැන යන්ත්‍ර රජ    වෙලා
විලි වසන් ගැමි ලියන් සිටි කාලෙ නිම    වෙලා
කලිසමෙත් කකුල් දෙක දෙතුන් පල හිල්    වෙලා

පෙච් කිරට අම්මාට මමී යැයි    පවසලා
පච් අනේ අප්පච්චි දැන් ඩැඩීලා    වෙලා
දෙච් අඩවි සහන් එළි ගොම්මනේ තනි    වෙලා
වෙබ් අඩවි ඔන්ලයින් දැන් ගමේ    පැතිරිලා

රණවරුණ පාඨක
සුරංග සෙනෙවිරත්න



# අපේ හෙළබස නිවැරදිව හසුරුවමු.

## බසක මහිම මැවූ රස පද ඇසේයා ...

භාෂාවක පවතින විවිධ වූ රටා සමුදාය එම භාෂාව හා සහසම්බන්ධ වූ සංස්කෘතියෙන් වෙන් කළ නොහැකි තරමටම එකට බැඳී ඇත. ඒ නිසාම ව්‍යවහාර භාෂාවේ අරුත් අවබෝධ කර ගැනීමට එම භාෂාව භාවිත වන සංස්කෘතියේද ආලෝකය ලැබිය යුතුය. මෙම ලිපිය තුළින් යොමුවනුයේ අප භාවිතා කරන අර්ථය පිළිබඳව අපට එතරම් අවබෝධයක් නොමැති වදන් කිහිපයක් පිළිබඳව විමසා බැලීමටය.

### සකඳ මලයි බඹලු වැලයි ...

අපේ හෙළ බස තුළින් නිරන්තරයෙන් ගැමි සුවඳ වහනය වන බව නම් කිව යුතුය. විශේෂයෙන්ම අපේ ගැමියන් මගුල් තුලාවකදී නව මනාල යුවලකට සුබ පැතුම් එක් කිරීමේදී සකඳ මලයි බඹලු වැලයි වගේ බොහෝ කාලයක් එකට එක්ව සතුටින් ජීවත් වන්නට සුබ පැතුම් එක්කරයි. එනම් අතීත පිටිසර ගමක පොල් අතු සෙවිලි කළ ගොම මැටි පිළියම් කළ සුන්දර ගෙපැලක පොල් අතු වහලයේ සිදුරකින් වැටෙන හිරු එළිය නිසා මැවෙන ආලෝක ලපයට තමයි සකඳ මල කියන්නේ. ඒ වගේම තමයි එම ආලෝක ලපය දිගේ ඉහළට ඇදෙන සියුම් අංශු ධාරාව තමයි බඹලු වැල කියන්නේ . සකඳ මලක් නොමැතිව කිසිදු විටෙක බඹලු වැලක් හට නොග නී. ඒ තරමට මේවා අතර අවියෝජනීය සබඳතාවක් පවතී. මෙම ස්වභාවික සංසිද්ධිය මනාල යුවලකට සුබ පැතීමට කෙතරම් ගැළපෙන්නේදැයි විමසූ විට සකඳ මලයි බඹලු වැලයි වගේ දෙදෙනා අතර ගොඩ නගාගන්නා කායික හා මානසික බැඳීම තුළින් බොහෝ කලක් එක්ව සතුටින් ජීවත් වීමට ලැබේවායි ප්‍රාර්ථනා කිරීම වඩාත් උචිත වුවක් බව පෙනේ. (මහාචාර්ය රාජ් සෝමදේවයන්ගේ දේශනයක් ඇසුරෙනි.)

### දන්න ඉටිගෙඩියක් නෑ ...

මෙය අප සාමාන්‍යයෙන් ව්‍යවහාර කරන වදනක් වුවද බොහෝවිට එහි අරුත හරි හැටි දන්නේද යන්න පිළිබඳව සැකයක් නම් උපදී. එනම් අතීත ගම්වල කුස්සියේ කොනක අනිවාර්යයෙන් තියෙන දෙයක් තමයි ඉටි ගෙඩිය කියන්නේ. අපේ ගැමියා කොස් පොලොස් අල බතල මෙන්ම අපට ආවේණික වූ සහලින් ස්වයංපෝෂිත වූවෙකි. ඒ නිසාම ගෙවත්තෙන් හෝ අසල්වැසි නිවසකින් ගෙනෙන කොස් පොලොස් කුස්සියේ වන සුලභ දසුනකි. එසේම පරිසරයෙන් ලබාගන්නා මී පැණි බඹර පැණි භාවිතයට ගැනීමටද ගැමියා අමතක නොකළේය. එනම් කොස් පොලොස් වලින් ගන්නා කොහොල්ලෑ ගුලියක් කුස්සියේ කොනක බිත්තියේ රඳවන අතර මී පැණි බඹර පැණි ලබා ගැනීමේදී ශේෂවන ඉටිද එම ගුලියටම එකතු කරයි. මේ අයුරින් ඉටිගෙඩිය නිර්මාණය වේ. ගැමි සංස්කෘතිය තුළ අල්ප බඩු මුට්ටු තුළින් සරල ජීවිතයක් ගත කරන අතර ඒවා අරපිරිමැස්මෙන් භාවිතා කිරීමද ගැමියන් තුළ දක්නට ලැබෙන ධනාත්මක ලක්ෂණයකි. එනම් කුස්සියේ භාවිතා කරන භාජන සිදුරු වූ විට ඉටි ගෙඩියෙන් ස්වල්පයක් රත්කොට රෙදි කැබැල්ලක් ආශ්‍රයෙන් පැලැස්තරයක් දමා



නැවත භාවිත කිරීමට පුරුදු වී සිටියහ. එපමණක් නොව වර්තමානයේදී කතා බහ කරන REUSE යන සංකල්පයට අනුව වරක් භාවිතා කළ දේ නැවත නැවත භාවිතා කිරීමේ සාධනීය ලක්ෂණය අපේ පැරණි සංස්කෘතිය තුළ දක්නට වූ බව මෙම ඉටිගෙඩිය හා සම්බන්ධිත ක්‍රියාකාරකම් තුළින් මනාව පිළිබිඹු වේ.

මෙසේ අපේ සිංහල ගැමි සංස්කෘතිය ආශ්‍රිතව නිර්මාණය වූ වදන් අදටත් ශේෂ වී පවතින අතර එම කියමන් ආශ්‍රිතව පවතින අප සංස්කෘතික උරුමය අතිශය සුන්දරය. ඒ නිසා අපද ඒවා පිළිබඳව දැනුවත් වී අපගේ බාල පරම්පරාවටද එම සංස්කෘතික ඥාණය පවරාදීම වැඩිහිටියන් වූ අප සතු උත්කෘෂ්ඨ වගකීමකි.



මේජර් දිල්හාරා දිසානායක ජාශිබ
BA sp (Hons), MA, PGDE,PGDC
Dip in Eng. Dip in Pali. Dip in Astr.
ප්‍රකාශන අංශය - ශ්‍රීලංයුහසෙව්බමු

## ඒකක තතු අභිමනින් ...

### 11 (සෙව්) ශ්‍රීලංසිරෙ

## නව සායන ගොඩනැගිල්ලක් ...





කුරුක්කල්මඩම් ප්‍රදේශයේ ස්ථාපිත 11 වන (සෙව්) සිංහ රෙජිමේන්තු ඒකක බලප්‍රදේශයේ ජීවත් වන ගර්භණී මව්වරුන් හා ළදරුවන්ගේ සායන කටයුතුවල අවශ්‍යතාව සපුරාලමින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම ජනවාරි මස 17 වන දින 231 පාබල බළසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව් එම් එන් කේ ඩී බංඩාර RWP RSP USP ndu ජ්‍යේෂ්ඨ නිලධාරී විසින් සිදු කරන ලදි. එංගලන්තයේ සේවයේ නියුතු නදීර කහටපිටිය ඇතුළු මිතුරු කැළගේ ධන පරිත්‍යාගයෙන් හා ඒකක අණදෙන නිලධාරී මේජර් ඩී එම් එන් පත්මසිරි ජ්‍යේෂ්ඨ නිලධාරීගේ මඟපෙන්වීම යටතේ ඒකක සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වයෙන් මෙම කාර්යය සිදු කරන ලදි. මේ අවස්ථාව සඳහා කොහොඹගස්තලාව පවුල් සෞඛ්‍ය සේවිකා චන්දිමා කුලකුලසූරිය ඇතුළු ප්‍රදේශවාසීන් පිරිසක් ද සහභාගී වූහ.

## සමස්ත ශූරතාව දිනාගනිමින් ...

### 3 (සෙව්) විපාරෙ





68 වන පාබල සේනාංක මූලස්ථානයේ 13 වන සංවත්සර දිනයට සමගාමීව 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර් ඩබ්ලිව් පොන්නම්පෙරුම RSP psc යන ජ්‍යේෂ්ඨ නිලධාරීගේ සංකල්පයකට අනුව එම බලප්‍රදේශයේ ස්ථාපිත බළසේනා මූලස්ථානයේ හා ඒකකයන් අතර පැවැත්වූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියේදී සියලු කණ්ඩායම් අභිභවනය කරමින් 3 වන විජයබාහු පාබල රෙජිමේන්තුව සමස්ත ශූරතාව දිනාගැනීමට සමත්විය. රණවරුණ ඔස්සේ අපිද ඔවුන් වෙත සුභාශිංසන එක්කරමු.

## 10 ශ්‍රීලංජාආබමු




# ජංගම දුරකථන අලුත්වැඩියාකිරීමේ මධ්‍යස්ථානයක් ...

ශ්‍රී ජයවර්ධනපුර නව යුද්ධ හමුදා මූලස්ථාන සංකීර්ණයේ රාජකාරී කරන සොල්දාදුවන්ගේ අවශ්‍යතාවක් සපුරාලමින් ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් 144 වන පාබල බළසේනාධිපති බ්‍රිගේඩියර් කේ එම් වී කොඩිතුවක්කු ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සුරතින් පසුගියදා විවෘත කරන ලදි. මෙම අවස්ථාව සඳහා 10 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුලුවේ අණදෙන නිලධාරී මේජර් අයි පී ආර් ධම්මික ජ්‍යෙෂ්ඨ නිලධාරී ඇතුළු ඒකක සාමාජිකයන් පිරිසක් සහභාගී වූහ

# 15 වන සංවත්සරය සමරමින් ...

## 17 (සේවි) ගරෙ





තඩ්ඩුවාන්, ඔඩ්ඩිසුඩාන් ප්‍රදේශයේ ස්ථාපිත 17 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවට වසර 15 ක් පිරීමේ සංවත්සරය පසුගියදා ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් ඉතා උත්කර්ෂවත් අන්දමින් සිදු කරන ලදි. ඒකක සංවත්සරයට සමගාමීව බෝධි පූජා පිංකමක් පැවැත්වූ අතර ඒකක අණදෙන නිලධාරී මේජර් ඒ එච් එම් එස් සී අබේසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පැවැත්වූ අතර සියලු නිල තේ පැන් සංග්‍රහයක්ද පවත්වන ලදි. සංවත්සර දිනය වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරී විසින් පැළයක්ද රෝපණය කරන ලදි.

## 15 (සෙව්) ශ්‍රීලංසිරෙ

## සමස්ත ශූරතාව දිනා ...



ශ්‍රී ලංකා යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පී ආර් පී ජයවර්ධන RWP RSP ndu ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක මලල ක්‍රීඩා තරගාවලිය මාර්තු මස 03, 04 සහ 05 යන තෙදින තුළ මධ්‍යම පලාත් ක්‍රීඩා සංකීර්ණය දිගන හිදී පවත්වන ලදි.

15 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඒකක අණදෙන නිලධාරි මේජර් ඒ එම් ඩී එස් තිලකරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අධීක්ෂණය යටතේ සහභාගී වූ මලල ක්‍රීඩා කණ්ඩායම අදාළ තරඟාවලියේදී ජවන හා පිටිය සමස්ත ශූරතාව, මලල ක්‍රීඩා ශූරතාව හා හොදම සහය කණ්ඩායමට හිමි ශූරතව යන ශූරතා ත්‍රිත්වයම දිනාගනිමින් සමස්ත තරඟාවලියේ ශූරතාව දිනා ගන්නා ලදි.

## කඳවුරට ජල පිරිපහදු යන්ත්‍රයක් ...

## 17 ශ්‍රීලංජාආබමු





ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ස්ථාපිත 17(සෙව්) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් ලයනල් හේමකුමාර ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ඉල්ලීමකට අනුව හොරණ පිහිටි බොඩිලයින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් එම ආයතනයේ මූල්‍යමය දායකත්වය මත කඳවුර තුළ ජල පිරිපහදු යන්ත්‍රයක් ස්ථාපනය කර ඒකකයේ රාජකාරී නියුතු නිලධාරීන්ගේ මෙන්ම සෙසු නිලයින්ගේ හා ප්‍රදේශවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා පසුගියදා විවෘත කරන ලදී.

## 2 (සේවි) ගරේ

## පුංචි සිතට අස්වැසිල්ලක් ...





ත්‍රිකුණාමලය පෙඩ්ඩ්‍රික් බලකොටුව ප්‍රදේශයේ ස්ථාපිත 2(සේවි) ගජබා රෙජිමේන්තුව විසින් පෙබරවාරි මස 26 වන දින ත්‍රිකුණාමලය 5 කණුව රේවත ළමා නිවාසයේ ළමුන් 27 දෙනෙකු හා පාලිකාවන් තිදෙනෙකු වෙනුවෙන් දිවා ආහාරය ලබාදීම, දරුවන් හට ත්‍යාග ප්‍රදානය කිරීම සහ සංගීත ප්‍රසංගයක් පැවැත්වීම අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් හා ඒකක සමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදි.

## 2 (සේවි) ශ්‍රීලයුපොදුසේබ

## ජාතික මළල ක්‍රිඩා ශූරියන්ට හරසර ...





ජාත්‍යන්තර කෙළිබිම නියෝජනය කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒකකවලට, රෙජිමේන්තුවලට, මෙන්ම ස්වේච්ඡා බළසේනාවට සහ සමස්ත යුද්ධ හමුදාවට අභිමානයක් ගෞරවයක් එක්කරයි. 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය නියෝජනය කළ ක්‍රීඩිකාවන් දෙදෙනෙකු වෙත සිය දක්‍ෂතා ඇගයීමට ලක්කරමින් රුः 10000.00 ක් බැගින් වු මූල්‍යමය ත්‍යාග මාර්තු මස 06 වන දින ඒකක අණදෙන නිලධාරී මේජර් පී ඩී එස් එන් ගුණරත්න ජ්‍යේෂ්ඨ නිලධාරිතුමන් විසින් ඒකක මුලස්ථානයේදී පරිත්‍යාග කරන ලදි.

ලාන්ස් කෝප්‍රල් හේරත් එච් එම් පී දකුණු ආසියාතික රට හරහා දිවීමේ තරඟයෙන් ලෝකඩ පදක්කම ඇතුළු ජාතික මට්ටමේ රන් රිදී පදක්කම් හිමිකර ගෙන ඇති අතර සාමාන්‍ය සෙබළ ජයමාන්න බී අයි එන් ක්‍රීඩිකාව 2022 ඉන්දීය ප්‍රාන්ත මීටර් 100 X 4 ඉසව්වෙන් රිදී පදක්කම ඇතුළු ජාතික මට්ටමේ ජයග්‍රහණ රැසක් හිමිකරගෙන ඇත. රණවිරුණ අප ද මෙම ක්‍රීඩිකාවන් වෙනුවෙන් සුබ පැතුම් පළකර සිටී.

9 ශ්‍රීලංජාආබමු

## බලඇණි පුහුණුවීම්...





පුදුකුඩිඉරිප්පු සුගන්ධිපුරම් ප්‍රදේශයේ ස්ථාපිත 9 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ බළඇණි පුහුණු පාඨමාලාව ජනවාරි මස 16 වන දින සිට මාර්තු මස 04 වන දින දක්වා 59 වන සේනාංක බළඇණි පුහුණු පාසල නන්දිකඩාල්හිදී සාර්ථකව පවත්වන ලදි. සාමූහිකත්වය මෙන්ම යුද්ධ හමුදා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වූ බළඇණි පුහුණු පාඨමාලාව සඳහා 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 06 x 308 ක නිලධාරී සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

3 (සේවා) ගැහේබ

## වෙරළ තීරය පිරිසිදු කරමින් ...






මාතර කොටුවෙහි ස්ථාපිත 3 වන ගැමුණු හේවා බළකාය 75 වැනි නිදහස් දිනයට සමගාමීව මාතර තානායම අසල සිට බ්‍රවුන්හිල් දක්වා වූ වෙරළ තීරය පිරිසිදු කිරීමේ කටයුතු පෙබරවාරි මස 08 වන දින සිදු කරන ලදි. ඒකක අණදෙන නිලධාරී මේජර් පී ඒ පී පී මඩිත්තපොල ජ්‍යේෂ්ඨ නිලධාරිතුමන්ගේ අධීක්ෂණය යටතේ ඒකක සාමාජිකයින්ගේ දායකත්වයෙන් සිදු කරන ලදි. පිරිසිදු කිරීමේ කටයුතු සඳහා කැසබෑ සංරක්ෂණ ව්‍යාපෘතිය, රුහුණු විශ්වවිද්‍යාලය, මාතර මහ නගර සභාව, සමුද්‍ර පරිසර ඒකකය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බාලදක්ෂ සංගමය ආදී විවිධ සිවිල් ආයතනවල සහයෝගයද ලැබිණ.

## 2 ශ්‍රීලංරබ

## ඒකක සංවත්සරය සමරමින් ...





බුද්ධංකෝට්ටේ කන්දකැපුල්පත ප්‍රදේශයේ ස්ථාපිත 2 රයිෆල් බළකාය සිය 15 වන බළඇණි සංවත්සරය පෙබරවාරි මස 15 වන දින අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඒ එම් එස් එම් කේ වැලිගෙපොල psc ගේ ප්‍රධානත්වයෙන් කඳවුරු භූමියේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් සමරන ලදි. සංවත්සර දිනය නිමිත්තෙන් අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයකින් හා සම්මාන පෙළපාලියකින් ආචාරය පුද කළ අතර සංවත්සර දින සිහිවටනයක් ලෙස රුක් රෝපණයක්ද සිදු කරන ලදි.

## රෙජිමේන්තු අධිපතිතුමන්ගේ ඒකක සංචාරය ...

## 9 (සේවි) ශ්‍රීලපාහ



කන්කසන්තුරේ ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකය වෙත ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සී ඩී වීරසූරිය RWP RSP ndu ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් මාර්තු මස 05 වන දින කඳවුරු සංචාරයක නිරත විය. සම්මාන මුරයකින් එතුමන් පිළිගැනීමෙන් අනතුරුව සංචාරය සිහිවීම පිණිස රුක් රෝපණයක් ද සිදු කළ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානීතුමන් ඒකක භට පිරිස් ආමන්ත්‍රණය කිරීමටද අමතක නොකළේය.

## නිදහසට අරුතක්
## රුක් රෝපණ වැඩසටහනක් ...

### 1 ශ්‍රීලංරබ





75 වන ජාතික නිදහස් දිනය නිමිත්තෙන් පෙබරවාරි මස 04 වන දින 1 වන ශ්‍රී ලංකා රයිෆල් බළකා කඳවුර තුළ රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. 1 වන ශ්‍රී ලංකා රයිෆල් බළකායේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් එම් ආර් ජයසිංහ ජ්‍යේෂ්ඨ නිලධාරිගේ අධීක්ෂණය යටතේ සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා 11 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් අර් බී අලුවිහාරේ RWP RSP USP ජ්‍යේෂ්ඨ නිලධාරිගේ, 111 වන පාබල බළසේනාධිපති බ්‍රිගේඩියර් රෝහිත රත්නායක RWP RSP ජ්‍යේෂ්ඨ නිලධාරිගේ සහ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ මහතා මෙන්ම දිස්ත්‍රික් ලේකම් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

## අතීත මතක ...



ලංකා ස්වේච්ඡා කාලතුවක්කු බළකාය දැක්වෙන ඡායාරූපයක්

# ගිණුම්කරණයෙන්



මේජර් ඩබ්ලිව් ඒ කේ ටී වික්‍රමසිංහ - ශ්‍රීලයුපොදුසේබ
BB Mgt (Accountancy)Sp, MBA (Finance),
HNDA, CA Sri Lanka (Final Stage)
මානි I ගිණුම් - ශ්‍රීලංයුහසෙව්බමු

පසුගිය කාලපරිච්ඡේදයෙහි සඳහන් කළ පරිදි රාජ්‍ය ගිණුම්, රාජ්‍ය නොවන ගිණුම් සහ පෞද්ගලික ගිණුම් පිළිබඳ දළ අවබෝධයක් ඇති අතර රාජ්‍ය නොවන අරමුදල් ගිණුම්කරණය පිළිබඳව තවදුරටත් විස්තර කිරීම මෙම ලිපියෙන් අපේක්ෂා කෙරේ.

ඒ අනුව හමුදා නියෝග 16/2017 හි දක්වා ඇති පරිදි රාජ්‍ය නොවන අරමුදල් ගිණුම්කරණයේදී ස්වාධීන ගිණුම් හා ස්වාධීන නොවන ගිණුම් ලෙස වර්ග කර ඇත.

රාජ්‍ය නොවන ගිණුම් (**Non Public Funds**)

01. ස්වාධීන ගිණුම්
    රෙආස ගිණුම
    නිලධාරී නිවස්න ගිණුම
    ස්වාධීනව පවත්වාගෙන යනු ලබන වෙනත් විශේෂ ගිණුම් (සේවා වනිතා ගිණුම්, සංවර්ධන ගිණුම්)

02. ස්වාධීන නොවන ගිණුම් (ස්වාධීන නොවන ගිණුම් යටතේ පවත්වාගෙන යනු ලබන උපගිණුම්)

    බනි/සැර නිවස්න ගිණුම
    කරණවෑමි ගිණුම
    ජන අවන්හල ගිණුම

අනෙකුත් ගිණුම් සමග සම්බන්ධතාවයක් නොමැතිව බාහිර රාජ්‍ය වාණිජ බැංකු සමග ගිණුම් කටයුතු පවත්වාගෙන යමින් ගණුදෙනු සටහන් කරණු ලැබීමේ හැකියාව මත ඉහත ගිණුම් වර්ගීකරණය සිදු කරයි. ප්‍රධාන වශයෙන් රෙආස ගිණුම් සහ නිලධාරී නිවස්න ගිණුම සඳහා බාහිර පාර්ශව සමග සම්බන්ධ වී ජංගම ගිණුම් පවත්වාගෙන යනු ලබයි. එහෙත් අනෙකුත් ගිණුම් පවත්වා ගැනීමේදී බාහිර බැංකු සමග සම්බන්ධතාවක් සිදු නොකරයි. ඒවායෙහි දෛනික ලැබීම් සහ ගෙවීම් කටයුතුවල බැංකුකරු ලෙස රෙආස කටයුතු කරයි.

ස්වාධීන නොවන උපගිණුම් සම්බන්ධව රෙආස ගිණුමේ වගකීම් අතර

- දෛනික මුදල් බාර ගෙන ඒ සඳහා කුවිතාන්සි නිකුත් කිරීම
- දෛනික උපගිණුම් වෙනුවෙන් ප්‍රේෂණපත් හා මුදල් නිකුත් කිරීම.
- කාර්තු අවසානයේ ශේෂ තහවුරු කරමින් ලිපි ලබා දීම වැනි ඒවා වේ.

ස්වාධීන නොවන උපගිණුම්වල කාර්යභාරය සහ වගකීම

- දෛනික ගණුදෙනු සඳහා ලැබෙන මුදල් හා ප්‍රේෂණපත් පිළිබඳ මූලික සටහන් තැබීමෙන් පසුව රෙආස වෙත භාරදීම.
- දෛනික අවශ්‍යතාවන් සඳහා ප්‍රේෂණපත් හා මුදල් රෙආස වෙතින් ඉල්ලුම් කිරීම.
- කාර්තු අවසානයේ ගිණුම් පරීක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ශේෂ තහවුරු ලිපි රෙආස වෙතින් ඉල්ලුම් කර ලබාගැනීම.

# හමුදා නිලධාරියෙකුගේ පුහුණුව තුළ ...



## 09 වන කොටස

ඕනෑම හමුදාවක සෙබළෙකුගේ වේවා නිලධාරියෙකුගේ වේවා පුහුණුවක මුදුන් මල්කඩ වනුයේ විසිරයෑමේ පෙළපාලියයි. තවත් ආකාරයකින් කියතොත් ඒ ඒ හමුදා ඒකකයන්ට අදාළව ලැබූ පුහුණුවේ වැඩ කිඩ පෙන්වන මෞලි මංගල්‍යයයි. එනිසාම නිලධාරියෙකුගේ නම් වසර දෙකක හෝ තුනක පමණ දීර්ඝ පුහුණුවක් අවසානයේ පෙන්වන වැඩ කිඩ එසේ මෙසේ නොවිය යුතුය. එනිසාම නිලධාරියෙකුගේ විසිරයෑමේ පෙළපාලි පුහුණුව මාසයක් හෝ දෙකක් පුරා අඛන්ඩව සිදු කිරීමට සියලු දෙනා වගබලා ගනී.

දීර්ඝ පුහුණු කාලයක් පසුකර ගැම්මට ඉතාලි බහින්නා සේ කඩු කිනිසි අමෝරා ගෙන පෙළපාලි භූමියට බහින්නේද නැකතකටය. එතැන් සිට මාසයක් දෙකක් පුරාවට සෙට් වෙන පූජාවලිය කෙළවර වන්නේ ලා නිල් පැහැති සෙබළුන් බිහිකරමිනි. ඒ තරමට අවි කාස්ටකය ආතල්ජනකය. සෞම්‍ය අව්වට අමතරව නන් දෙසින් ගලා එන නේකවිද දුක්ඛ දෝමනස්සයන් බොහෝය. පෙළපාලි පුහුණුවීම් සිදුවන සෑම දිනකම යුද්ධය ඇරඹෙනුයේ හිමිදිරි උදාසන ආමරිය (ආයුධාගාරය) වටා රංචු ගැසෙන පාස්අවුට් වන ජ්‍යේෂ්ඨයන්ගේ මෙන්ම බැකප් එකට පෙළ හදන කනිෂ්ඨයන්ගේ අන්‍යෝන්‍ය සුහදතාව ඔප්නංවමින්, පරක්කු වී වෙපන් ගැනීමට එන හැම ඉන්ටෙක්වලම අයට ජ්‍යේෂ්ඨයින් විසින් කන හරහා මොළයට ලබා දෙන සිම්බල් පහරවල් සහ ව්‍යායාම් ක්‍රමවලිනි. සිම්බල් පාට් එක කෑමට අමතරව පේළියට නටි හිඳ එක එකා නැගිට නැගිට ගොස් සිරිමත්ලා මෙන් වෙපන් ගෙන හා පැටවුන් සේ පෙළ සදන ආකාරය සැබවින්ම ඉතා දැකුම්කළු දර්ශනයකි. එය එතරම් අවිහිංසාජනකය.

ඉන් අනතුරුව එළඹෙන්නේ කලුවා ආවේස වූ සරඹ උපදේශකයින්ගේ යාමයයි. මුල් කාලයේ උදාසන හයට පමණ අරඹෙන සරඹ සන්නිය තේ වෙලාවට ලබාදෙන විනාඩි 15 ත් දිවා ආහාරයට ලබාදෙන පැයත් හැරුණු විට නන්ස්ටොප් ගලාබසී. පාස් අවුට්වීමේ හීනය ගව් එක්දාස් එකසිය එකොළහක් දුර තිබෙන සෝපාකලා රාජකාරියේ යොදවනු ලබන්නේ බලු පාටියට හෙවත් සරඹ පිටියට එන බල්ලන් එලවීම සඳහාය. දෙවන අර්ධයේ හෙවත් සෙකන්ඩ් ටර්ම් එකෙහි රැඳීසිටින මධ්‍යතන යුගයේ අමාත්‍යංශ බලධාරීන් යනු සියල්ලන් අතරින් දරුණුතම සත්ව කොට්ඨාශයකි.

පාස්අවුට්වීමට වරම් ලද භාග්‍යවත් ජ්‍යේෂ්ඨයන්ට වඩා වැඩේ දුෂ්කර වන්නේ පරිවාර (බැකප්) කාණ්ඩයේ උතුමන් වහන්සේලාගෙන් ජීවිතය බේරා ගැනීමය. එක් පෙර පුහුණු වාරයක් අවසානයේ අපි වලෙන් ගොඩට එන්නේ මරන්ඩ ගෙනියන හරකුන් සේය. දිනපතාම උදේ 6 සිට හවස 6 තෙක් මේ තොවිලය නටද්දී දින කිහිපයක් යද්දී ගිනි කාෂ්ඨක අව්වේ හිටගෙන නින්ද යෑමට පටන් ගැනීම ඉතා සාමාන්‍ය ජීවවිද්‍යාත්මක සංසිද්ධියකි. එවන් අසිරිමත් ජාතියක් වූ අප අතින් හිටගෙන නිදා සිටින විටදී අතහැරෙන වෙපන්වලට අදාළව නම් ලකුණු කිරීමේ පොත නඩත්තු වූයේ බැකප් එකේ ජ්‍යේෂ්ඨයන්ගෙනි. එවන් හපන්කම් සඳහා සරඹ පිටියේදී උපදේශකයන්ගෙන් ලැබුණු ඔන් ද ස්පොට් අතට සල්ලි සහ සුමිහිරි ගුණ ගායනා සෑමවිටම අහවර වූයේ තේ වෙලාවේ ගල් පිටි කළ බනිස්, බිස්කට්, පේර කෝට්ටු පූජා, ක්ලීනිං රොඩ් පූජාවලිනි.

ක්ලීනිං රොඩ් එක ගැන මෙහිදී විශේෂයෙන් කිව යුතුය. ක්ලීනිං රොඩ් එක වූකලි ටී 56 අවි ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා සුද්දා විසින් ලෝහයෙන් සාදන ලද කෝටු ආකාර උපකරණයක් වුවත් බොහෝ විට එය අප වැනි චූදිතයන් වරදින් මුදවා අපද ක්ලීන් කර චරිත ශෝධනයට යොදා ගත් රන් කෙවිටකි. ගොපලු යකාටද කන්ට්‍රෝල් නැති යකුන්, පෙරේතයන් හා කුම්භාණ්ඩයන්

ක්ලීනිං රොඩ් එකෙන් ආම්බාන් කිරීම අපේ උත්තමයන් හට ඉතා සරල ක්‍රියාදාමයක් විය. එක් රියර්සල් එකක් අවසාන වී සරඹ පිටියෙන් උඩට එනවාත් සමගම "ඔක්කොම ඩවුන්" කියාගෙන තම අවියෙන් ක්ලීනිං රොඩ් එක ගලවමින් අවි අමෝරාගෙන කඩා වදින, කලුවා ආවේශ වූ ජ්‍යේෂ්ඨයන් අවිහිංසක හා නිර්මල වූ අපේ පශ්චාත් භාගයන් හරහා ඒවා ගමන් කරන්නේ කොත්තු රොටී ගසන ආකාරයටය. පෙරඩ් බැකප් එකක සිටිනවුන්ගෙන් ක්ලීනිං රොඩ් පහරක් නොකෑ පස්සක් හිමි එකෙකු සොයා ගැනීම, අද පාස්පෝට් නොහැදූ එකෙකුගේ ගෙයකින් රම්පේ කොලයක් සොයනවා වැනි දුෂ්කර කටයුත්තකි.

මීට අමතරව තනි තනි බුල්වලට තනි තනි වශයෙන් සරඹ භූමිය වටා වෙපන් ඔසවාගෙන දුවන කැඩ්ඩන් සේම සාමූහික බුල් සඳහා කඩු කිනිසි එල්ලාගෙන සරඹ පිටියට යාබද සුන්දර පෝලෝ ග්‍රවුන්ඩ් භූමි භාගයට ඉහළින් ධවල වර්ණයෙන් සදා දිලෙන "වයිට් ගේට්" එක ස්පර්ශ කර පව් සෝදාගෙන එන බලඇණිද ඊටත් එහා මාරාන්තික බුල් සඳහා එකී ලෙසම කඩු කිනිසි එල්ලාගෙන ලීඩර්ස් පාත් එකේ සිට ඇල්ලගම හන්දිය, ජයමිණිපුර හන්දිය හරහා අලුත්වෙල බී ගේට්ටුව දක්වා දිවෙන සැතපුම් 4 ක සාමූහික මැරතන් ධාවක බලඇණිද මේ කාලයේ ඇකඩමිය සමීපයේ ජීවත් වූ සිවිල් ජනතාවට ඉතා සොම්ජනක, සුලබ මෙන්ම දැකුම්කලු දසුනක් විය.

බොහෝ විට මේ සොම් පැකේජ සෙට් කළේ විද්‍යාපීඨ සැරයන් මේජර්වරයා හෙවත් ඒවිඑස්එම් හෝ පක්ෂාංග සැරයන් මේජර්වරයා හෙවත් ඩබ්ලිව්එස්එම් විසිනි. සැබවින්ම ඔවුන් සරඹ භූමිවලටම පත්තියම් වූ බහිරවයන් වැනි මිනිස් කොට්ඨාශයක් වූ අතර රූස්ස ගස් මෙන් විහිදී පැතිරුණු මහා පෞරුෂයක් දැරූ යෝධයන් විය. විඩාබරිත ජීවිත ගෙවූ විද්‍යාර්ථයින් වූ අප ඔවුන්ගේ ඒ යෝධ පෞරුෂ ලක්ෂණවලින් ආතල් ගැනීම පුරුද්දක් කරගෙන සිටියද සැබවින්ම ඔවුන් විනයක් සහිතව ආදර්ශමත් චරිත ලෙසින් අප වෙත විද්‍යාමාන වූ චරිත විය. කිඹුලා සූඩයා වැනි ආතල්ජනක නම් ගොත්වලින් අප ඔවුන් හැඳින්වුවද ඔවුන් සැබවින්ම වීරයන් බව පසු කලෙක අපට පසක් වූයේ පුහුණුවෙන් පසු බලඇණි තුළ රාජකාරීවලට වැටීමෙන් පසු එවැනිම පරිණත මිනිසුන් සමග වැඩ කරද්දීය.

සරඹ තුළින් විනය තැනෙන බව අප මුල සිට අග දක්වාම ඉහත කී සරඹ උපදේශක කණ්ඩායම විසින් ඔලුගෙඩිවලට පොවා තිබුණද එහි අරුත අපට වැටහුණේ පුහුණුවෙන් පසුවය. රෑපුරා නිදි වරා සකස් කළ ඇඳුමත්, බූට් යුවලත් කිටිකිටියේ ඇඳ සුපිරිසිදු මහත්වරුන් ලෙස උදෑසන මස්ටර් සඳහා පෙනී සිටීමෙන් පටන් ගෙන ගිනි කාෂ්ඨක අව්වේ දහඩිය වගුරුවා කිව නොහැකි තරම් කායික වෙහෙසක් දැනෙද්දී එය තවත් ඉවසමින් තවත් එකෙකුගේ අණ වචනයට පමණක් සවන් දෙමින් එයට කීකරු වීමට නම් සැබවින්ම මිනිසකු තුළ සාමාන්‍ය පරිමාව ඉක්මවා ගිය විනයක් තිබිය යුතුය.

එකී මෙකී නොකී සියදහසක් ගැහැට දරාගෙන වසර දෙකක් පුරා සරඹ කර ඒ පිටියෙන්ම යම් දිනෙක අවසන් පෙර පුහුණුවේදී අප ධවල වර්ණ වූ මකර තොරණින් ඉහළට පියමං කළා නම් ඒ නිකම් නොව නැකතටය. ඒ පියවර ඒ තරම් ප්‍රබලය. එය එතරම් බැරෑරුම් ලෙස සෙබළ දිවියට වැදගත්බව අපේ සරඹ උපදේශකයින් විශ්වාස කලෝය. යමෙක් එම අවසන් පෙර පුහුණු දින අසිපතක් අතින් දරාගෙන ඉහළට පියමං කළා නම් ඉන් මත්තට ඔහුට කිසිදු හේතුවක් නිසා අසිපත අහිමි නොකිරිණි. කෙටියෙන් කියතොත් තමාට කණිෂ්ඨ වූ පාඨමාලාවකට රෙලිගේට් නොකිරිණි. විසිරයෑමේ පෙළපාලියක් සැබවින්ම සෙබළෙකු හට කප්රුක් පූජාවක් හා සමානය. ඒ සඳහා ඒ තරමටම මිනිසෙකු වශයෙන් භාරදූර ලෙස කැපකිරීම් කරනු ලබන නිසාවෙනි. සරඹ පිටියකින්ම පුහුණුව ලබා සරඹ පිටියකින්ම පුහුණුව අවසන් කර සොල්දාදුවෙකු විසිර යැවීම පිටුපස ඇති සැබෑ වෘතාන්තය නම් ඒ සෑම පස් පිඩක් මතම උන් විසින් හෙළන දහඩිය සහ ඉන් ශරීරගත කරනු ලබන විනයයි. ඒ දහඩියට, වේදනාවන්ට කැපකිරීම්වලට, ඉවසා දරාගැනීම් සහ විනයට අන් කිසිවෙකුටවත් අභියෝග කළ නොහැක්කේ එනිසාමය.



මේජර් අෂාන් සංජීව ශ්‍රීලවියාඉ
පිරිස් පාලන අධ්‍යක්ෂක මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය



**දශක තුනක යුද්ධය නිමවී වසර 14 කට ආසන්නය. නිදහස හා සාමයේ ප්‍රතිලාබ භුක්ති විඳිමින් සමස්ත රටවැසියන්ම සිය ජීවන අරගලයන්හි නිරතව සිටින අතරතුර රණවිරුවන්ද එතෙක් කළක් තම අතරැඳි ගිනි අවි පසෙකලා නිහඬ මෙහෙවරක නියැලී සිටී. එවක සටන් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා ඇරඹි සංවර්ධන සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස එහි පෙර වූ යුද්ධයේ නටඹුන් සහමුලින්ම මැකී ගොස්ය.**

**සියල්ල එසේ වුවද රණබිමෙහි මානුෂීය ගුණ රැඳි මතක සටහන් එලෙස මැකී යා නොදී සමාජගත කිරීම කාලීන අවශ්‍යතාවක් සේ හැඟේ. රණවිරුවන් සතුව තිබූ වීරත්වය, දේශානුරාගය, බිය, සැක, දුක, වේදනාව හා සතුට හමුවේ ඔවුන් සිය ජීවිතවලට මුහුණ දුන් අපූරුවද එකී මතක සටහන් විශ්ලේෂණය කිරීමේදී කදිමට විද්‍යමාන වේ. " පය අළී බිම ළය රැඳී මතක " තුළින් දිගහැරෙනුයේ එදවස රණබිමේ සැඟවුන සුන්දර කතන්දරයි ...**

# විජේබණ්ඩාගේ නිවාඩුව ....

### 44 කලාපය සමඟ සබැඳේ ...

118 කඳවුරේ කටයුතු එලෙස ගලායද්දී ක්‍රියාන්විත අවශ්‍යතාවක් මත මා හට හදිසියේ යාබද "ඇනිකට් හන්දිය" කඳවුරට මාරුවීමට සිදුවිය. අනපේක්ෂිත ලෙස එම කඳවුරේ සිටි නිලධාරියා ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් මියයෑම මාහට එම කඳවුරට මාරු වීමට බලපෑ හේතුව විය. ඒ සමගම එතෙක් මා සිටි කඳවුරටද වෙනත් නිලධාරියකු වාර්තා කළ අතර ඔහුද එම ප්‍රදේශයේම වූ වෙනත් කඳවුරක සිට පැමිණ තිබිණ. කෙසේ වුවද මා වඩාත් ප්‍රිය කළ එම 118 කඳවුර හා එහි සෙබළු හැරදමා යාමට සිදුවීම පිළිබඳ මා තුළ වූයේ පශ්චාත්තාපයකි. කඳවුරෙන් නික්මයාමට මොහොතකට පෙර සෙබළ විජේබණ්ඩාර මා හමුවට පැමිණියේ කෝඩියල් බීම වීදුරුවක් තැබූ ට්‍රේ බන්දේසියක්ද අතැතිවය. ඒ වන විට වෛද්‍ය සහායක කෝප්‍රල්වරයා නිවාඩු මත සිටි බැවින් වෛද්‍ය පරීක්ෂණාගාරයේ කටයුතු පැවරී තිබුණේ සෙබළ විජේබණ්ඩාරටය. "බීම එකක් බොමු සර්" එහිදී ඔහු කිව්වේ බොහෝ ළෙන්ගතුකමිනි. එවක ක්‍රියාන්විත ප්‍රදේශවල පිහිටි සෑම හමුදා කඳවුරකම තිබූ වෛද්‍ය පරීක්ෂණාගාරවල කෝඩියල්, නෙස්ටමෝල්ට් ආදිය සුලභ විය. එසේම යුද්ධය පැවතියද එකල ඕනෑම බෙහෙත් වර්ගයක් ද හිඟ නොවීය. ඒ අනුව කඳවුරේ අසනීප වන සෙබළුන්ට කෝඩියල් හෝ නෙස්ටමොල්ට් ආදිය අමතරව සැපයූ අතර කඳවුරුභාර නිලධාරී ලෙස මා හටද ඉන් කෝඩියල් වීදුරුවක් සාදා දෙන්නට සෙබළ විජේබණ්ඩාර අමතක නොකළේය. එවක ක්‍රියාන්විත සේවාවන්හි නියැලී සිටියදී එලෙස කඳවුරේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් කෝඩියල් වීදුරුවක් නොබිව් අයෙකු සොයාගත නොහැකි තරම්ය.

යාබද ඇනිකට් හන්දිය කඳවුරේ රාජකාරි භාරගෙන දින කිහිපයක් යනතෙක්ම මා සිත තුළ වූ නොසන්සුන්බව පහව නොගියේය. විශේෂයෙන්ම එම කඳවුර භාරව සිටි ලුතිනන් වරයාගේ මියයෑමට අදාළ සිදුවීම ද පෙර මා සිටි 118 කඳවුරේ භටපිරිස් හදිසියේ දමා ඒමට සිදුවීමද මා සිත නිරතුරු දවන්නට විය. එසේම අවට ප්‍රදේශයේ ත්‍රස්ත ක්‍රියා දිනෙන් දින උත්සන්න වෙමින් පැවති අතර ඒවාට මුහුණ දීමේදී බොහෝ සෙයින් කැපවන්නට ද අප හට සිදු විය. ප්‍රදේශය අවට වෙනත් කඳවුරු ආශ්‍රිතවද නිරතුරු යුද ගැටුම් සිදුවූ අතර ඒ හේතුවෙන් දිනපතා හමුදා සාමාජිකයන් හා ත්‍රස්තවාදීන් මියයෑම සාමාන්‍ය කරුණක් බවට පත්වන්නට විය.

මේ අතර තවත් දිනකට හිරු උදාවූයේ අනපේක්ෂිත ලෙස අභාග්‍යසම්පන්න සිදුවීමකට මුලපුරමිනි. මා පෙර සිටි 118 කඳවුරු බලප්‍රදේශයේ තදබල යුද ගැටුමක් ඇති වූයේ එදින හිරු උදා වී පැය දෙක තුනක් ගතවන්නටත් මත්තෙන්ය. සිද්ධිය සැලවීමෙන් අනතුරුව මා වහා සෙබළු පිරිසක්ද සමග එහි ගියද ඒ වනවිටත් සියල්ල හමාර වී තිබිණ. එහිදී සිදුව තිබුණේ 118 කඳවුරේ භටපිරිස් වෙත මාර්ග පරීක්ෂා කිරීමේ ක්‍රියාන්විතයේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ලවීමය. දෙපාර්ශවය අතර ඇවිලුණු එම ගැටුම එතරම් වෙලා නොපැවතිය ද හමුදා සාමාජිකයන් දෙදෙනෙකු තුවාල ලැබ එක් අයෙකු අතුරුදන්ව තිබිණ. එසේම අවට තිබූ සලකුණු අනුව පැහැදිලිවම පෙනෙන්නට තිබුණේ ත්‍රස්තවාදීන්ට ද එමගින් බරපතළ හානි සිදුව තිබූ බවකි.

ඒ වන විට ඔවුන් ප්‍රදේශයෙන් පලාගොස් තිබුණද අතුරුදන් වූ සෙබළා සොයා ක්ෂණික ක්‍රියාන්විතයක් ද එහිදී ඇරඹීය. පසුව බුද්ධි අංශ මගින් හා වෙනත් විශ්වාස කටයුතු තොරතුරු ඔස්සේ දැනගනු ලැබුයේ ප්‍රහාරයෙන් මියගොස් සිටි සෙබළකුගේ සිරුර ත්‍රස්තවාදීන් විසින් රැගෙන ගොස් තිබූ බවකි. එහිදී වඩාත්ම හද දවන සිදුවීම නම් එලෙස අතුරුදන්ව තිබුණේ 118 කඳවුරේ සිටි සෙබළ විජේබණ්ඩාරය. සිය LMG අවියද රැගෙන මාර්ග ආරක්ෂාව සැලසීමේ ක්‍රියාන්විතයට එක්ව සිටි ඔහු ඇතුළු භටපිරිසට මග රැකසිටි ත්‍රස්තවාදීන් එලෙස ප්‍රහාරයක් එල්ලකොට තිබිණ.

එම සිදුවීමෙන් පසු පෙර සිටි 118 කඳවුරෙහි සෙබළ විජේබණ්ඩාර හා බැඳුණු මතක නිරන්තර මා සිත දවාලන්නට විය. මා එහි සිටියේ නම් එම සිදුවීම වළක්වාලීමට හැකිව තිබූ බවට මා තුළ වූයේ දැඩි විශ්වාසයකි. කෙසේ හෝ කිසිවක් ආපසු හැරවිය නොහැකි ලෙස සියල්ල සිදුවී හමාරය. යුද බිමක පයගසා සිටින ඕනෑම අයෙකුගේ ඉරණම අසුරු සැණින් වෙනස් විය හැකිය. ත්‍රස්තවාදයේ ස්වභාවය එයයි. සැමටම පොදු එම ධර්මතාව පිළිබඳව යථාර්ථය අකමැත්තෙන් වුව පිළිගත යුතුව තිබේ. විජේබණ්ඩාරගේ අතුරුදන්වීමෙන් දින දෙකකට පසු එල්ටීටීඊ සංවිධානය විසින් ඔහුගේ සිරුර සිය පාලනය යටතේ පැවති වාකරේ ප්‍රදේශයේ දී ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයට භාර දී තිබුණි. අනතුරුව එය ඔවුන්ගේ භාරයේ වාලච්චේන වෙත ගෙන ඒමෙන් අනතුරුව හමුදා ආරක්ෂාව යටතේ පොළොන්නරුවටත් එතැන් සිට ඔහුගේ නිවසටත් පිටත්කර හැර තිබිණි. මෙහි තවත් විශේෂත්වයක් වූයේ සෙබළ විජේබණ්ඩාරගේ සිරුර ඔහුගේ නිවස වෙත යවා තිබුණේ ඔහු නිවාඩු යාමට නියමිතව සිටි නත්තලට පෙර දිනයේදීමය. සුපුරුදු ලෙසම විජේබණ්ඩාර මෙවර නත්තලේදීද සිය නිවස වෙත ගිය ද අවාසනාවන්ත ලෙස නත්තලේ අර්ථය වූ ප්‍රේමය හා සාමය ඔහුට අහිමිවී තිබුණි.

ඇනිකට් හන්දිය කඳවුරෙහි මා සිටි නිලධාරී නිවස්නය සාදා තිබුණේ මහා මාර්ගය හොඳින් පෙනෙන තැනකය. එයද ටකරන් තහඩුවලින් වටකොට ඉලුක් හා පොල්අතු සෙවිලි කර තැනූ ඉතා සරල එකකි. එදින අවදිව මා එහි කවුළුවෙන් පිටත බැලුවේ සෑම හිරු උදාවකම දැනෙන අවිනිශ්චිත බවින් යුතුවය. පොළොන්නරු මඩකලපු ප්‍රධාන මාර්ගය එක එල්ලේ පෙනුණද උදෑසන නිසාදෝ එතෙක් එහි වාහන ධාවනය වීමක් නොපෙනිණි. පාළු මුසලබව අතරේ වුව කඳවුර වටා පිහිටි තේක්ක ගස් යාය සිසාරා ඇදී එන සුළං සැරින් නිලධාරී නිවස්නයේ ජනේලය ආවරණ කොට තිබූ කළු පැහැති ඉටිකොළය සර සර හඬ දෙමින් සෙලවෙන්නට විය. "සර් තේ එකක් බොමු" මා තිගැස්සී එතෙක් නිමග්නව සිටි කල්පනාවෙන් මිදී හැරී බැලුවෙමි. නිලධාරී නිවස්නයේ කටයුතුභාර සෙබළා මා අසල වූ කුඩා බංකුව මත තේ කෝප්පයක් තැබුවේය. මම මොහොතක් ඒ දෙස බැලීමි. තේ කෝප්පය වෙනුවට මට එහි පෙනුණේ කෝඩියල් වීදුරුවකි. විජේබණ්ඩාරගේ රුව එතුළින් මැවී පෙනෙන්නට විය



ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ
මනෝ විද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

## මූලික උපදේශන පාඨමාලාව සම්පූර්ණ කරමින් ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ මානි I (විගණන) ලෙස රාජකාරී කරනු ලබන ලුතිනන් කර්නල් එම් ඒ සී පී මාරසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මනෝ විද්‍යා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර 2022 ජුනි මස 02 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී සිය ඩිප්ලෝමා සහතික පත්‍රය ලබාගන්නා ලදී. රණවරුණ කණ්ඩායම විසින් එතුමන්ට මෙසේ සුභාශිංසන එක්කර සිටිමු.






# දුම්වැටියෙන්

## මෙවර දිවියට සුවයක් තුළින් ඔබට ගෙන එනුයේ ...

### 44 කලාපය සමඟ බැඳේ ...

සුන්දර සත්‍යය නම් මෙම පිළිකා දණ්ඩ ඔබ වෙනුවෙන් ඔබට යහපතක් සිදුවන කිසිවක් නොකරන බවයි. දුම්පානයෙන් ඔබට සැලසෙන කිසිදු වාසියක්ද නොමැත. මෙතෙක් පැවති එකම වාසිය වූයේ එය සමාජශීලීවීමට උපකාරවන්නේ යැයි සිතීම පමණයි. වර්තමානයේ දුම්පානය කරන්නන් පවා එය සමාජ විරෝධී පුරුද්දක් ලෙස සලකයි. දුම්පානය කරන්නන් බොහොමයකට එය සාධාරණීකරණය කිරීම අත්‍යවශ්‍යබව පෙනෙන නමුත්, දුම්පානය කිරීමට අපට ඇති හේතු සියල්ලම මුලා සහගත මිත්‍යාවන්ය. මෙම මුලා සහගත මිත්‍යාවන් ඔබේ මනසින් ඉවත් කළ විට අත්හැරීමට කිසිවක් නොමැති බව ඔබටම වැටහෙනු ඇත. අතහැර දැමීමට කිසිවක් නොමැතිවා පමණක් නොව, දුම් නොබොන්නෙකු වීමෙන් පුදුමාකාර, ධනාත්මක වාසි ලැබෙන අතර, සෞඛ්‍යය හා මුදල් යනු මෙම වාසිවලින් දෙකක් පමණි. දුම්වැටිය නොමැතිව ජීවිතය කිසි විටෙකත් ප්‍රීතිදායක නොවනු ඇතැයි යන මිත්‍යා මතය ඉවත් කළ පසු, එය නොමැතිව ජීවිතය ප්‍රීතිදායක වනවා පමණක් නොව, දුම්වැටිය අහිමි වූ හෝ නැතිවී ගිය හැඟීම තුරන් වූ පසු, සෞඛ්‍යය හා මුදල් පිළිබඳව සහ දුම්පානය නැවැත්වීමට අනුබල දෙන වෙනත් හේතු දුසිම් ගණනක් නැවත සලකා බැලීමට ආපසු යා හැකිය. දුම්කොළයට ඇති වහල්භාවයෙන් තොරව ඔබේ මුළු ජීවිත කාලයම ගතකිරීමට හා කැමති දේ සාක්ෂාත් කර ගැනීමට මෙම අවබෝධය ධනාත්මක ආධාරකයක් වනු ඇත.

දුම්පානය කරන්නා යම් මොහොතක සිගරට්ටුවක් දල්වා ගනී. එය අප්‍රියජනක රසයක් උපදවයි. මෙය කළ යුත්තේ ඇයි දැයි යන්න බේරුම් කර ගැනීමට ඔහු වෙර දරයි. දිනපතා දුම් උරන අයෙකුගෙන් ඔබ මෙසේ ඇසුවහොත්, ඔබ දුම්පානයට අසුවෙන්නට පෙර සිටි කාලයට දැන් ඇති අත්දැකීම් සමගින් නැවත යාමට වරමක් ලබා දුනහොත් යළි දුම් ඉරීම ආරම්භ කරනවාද? කියා විමසුවහොත් අනිවාර්යයෙන්ම පිළිතුර වන්නේ එහෙම වෙන්න විදිහක් නැහැ යන්නයි. දුම් ඉරීම තමන්ට හානිකර බව පිළිනොගන්නා, සමාජ අපකීර්තිය පිළිබඳ නොසලකන, වියදම දරා ගත හැකි දුම් උරන අයෙකුගෙන් ඇසුවහොත් ඔබ ඔබේ දරුවන්ව දුම් ඉරීම ධෛර්යමත් කරනවා ද කියා, ලැබෙන පිළිතුර නම් එහෙම වෙන්න විදිහක් නැහැ යන්නයි.

තමා යම් නපුරු දෙයකට හසුවී ඇති බව දුම් උරන සියලු දෙනාටම දැනේ. මුල් දිනවලදී නම් මම නවත්වන්නට යනවා, හැබැයි අද නොවේ හෙටයි යනුවෙන් පැවසුව ද අවසානයේ චිත්ත ධෛර්යය සිඳීගොස් ජීවිතය ආස්වාදනය කිරීම සඳහා සිගරට් සතු ආවේණික හැකියාව ප්‍රයෝජනයට ගත යුතුය යන වැරදි නිගමනයට එලඹෙනු ඇත.

දුම්බීම යනු අසාමාන්‍ය ප්‍රහේලිකාවකි. එය ඇඟේ දමා ගැනීමට බලපාන ප්‍රධාන කරුණ වන්නේ මිනිසුන් ලක්ෂ ගණනාවක් දුම් ඉරීමයි. ඔවුන් ආස්වාදයක් නොවිඳිතියි කියා අපට සම්පූර්ණයෙන්ම විශ්වාස කළ නොහැක. ඇතැමෙක් දුම් ඉරීම පරිණතබවේ ලක්ෂණයක් යැයි පවසමින් එයට හසුවීම සඳහා බොහෝ පරිශ්‍රමයක් දරති. අනතුරුව ජීවිතයේ ඉතිරි කාලය ළමුන්ට එය නොකරන ලෙස පවසමින් ගෙවා දමති.

දුම් උරන්නෙකු ජීවිත කාලය පුරාවටම දුම්වැටි සඳහා අධික මුදලක් වැය කරයි. දිනකට සිගරට් විස්සක් පමණ පාවිච්චි කරන අයෙකු ජීවිත කාලයටම (රු.100 x සිගරට් 20 x දින 30 x මාස 12 x අවුරුදු 50) රුපියල් මිලියන තිස් හයකටත් වඩා වියදම් කරයි. ඒ මුදල්වලට අපට කළ හැක්කේ කුමක්ද? අප ඇත්තවශයෙන්ම ඒ මුදල් පාවිච්චි කරන්නේ අපේ පෙනහළු ක්‍රමානුකූලව පිළිකාකාරකවලින් පුරවා රුධිර නාලවලට වස කැවීමටය. සෑම දිනකම වැඩිවැඩියෙන් අප මාංශපේශීන් සහ අවයව ඔක්සිජන් හා පෝෂණ ද්‍රව්‍ය ලබා නොදී හාමතේ තබා අප්‍රාණික තත්වයට පත් කරන්නෙමු.

අපි අපව මුළු ජීවිත කාලය පුරාවටම අප්‍රියජනක දුම් ගඳට, දුර්වර්ණ වූ දත්වලට, පිළිස්සුණු ඇඳුම්වලට, පිළිකුල් අළු බඳුන්වලට නියම කරගෙන සිටින්නෙමු. එය මුළු ජීවිත කාලයටම තිබෙන වහල්බවකි. අපි ජීවිත කාලයෙන් අඩක්ම දුම් ඉරීම තහනම් කොට ඇති ස්ථානයන්හි ගත කරමු. (පල්ලි, රෝහල්, පාසල්, දුම්රිය, සිනමාහල්) නවත්වන්නට හෝ අඩු කිරීමට උත්සාහ කළ විට යමක් අහිමි වූ හැඟීමෙන් යුක්තව සිටින්නෙමු. ජීවිත කාලයම දුම් ඉරීමට ඉඩප්‍රස්ථා ඇති ස්ථානවල ගත කළද එසේ නොකළා නම් හොඳ යැයි සිතන්නෙමු. කරන විට එය නොකළා නම් හොඳයි යනුවෙන්ද නොකරන විට කිරීමට මහත් ආශාවක්ද ඇතිවන අපවම අප රවටා ගන්නා විනෝදාංශයේ ඇති හරය කුමක්ද? එය මනා සිහිබුද්ධියෙන් යුතු ලස්සන මනුෂ්‍ය ජීවිතය තමන්ම පිළිකුල් කරගන්නා තත්වයට පත්කරයි.

සෑම දුම්වැටි නිවාරණ දිනකම, සිගරට් පැකැට්ටුවේ මුද්‍රණය කර ඇති රූපමය අවවාදය අවධාරණයෙන් තොරව දකින සෑම මොහොතකම, පපුව හිරවී වේදනා දනවන සෑම මොහොතකම , දුම් ඉරීම නොකරන්නන් අතර ගැවසෙන සෑම මොහොතකම පීඩාවෙන් සිටීමට දුම් උරන්නාට සිදුවේ. මනස තුළ හොල්මන් කරන අඳුරු සෙවණැලි සමඟ ගෙවන ජීවිතයෙන් ලැබෙන්නේ  කුමක්ද? සතුට? රසාස්වාදය? සැහැල්ලුව? රුකුල? ධෛර්යය? කණගාටුයි ! මේ සියල්ලම මායාවන්ය. එය සතුටක් ලබා ගැනීම සඳහා සපත්තුව හිරට පැළඳගෙන බුරුල්කර ගන්නවා හා සමාන ක්‍රියාවකි.

සමහර විට ඔබ මෙසේ පවසනවා ඇත. ‘ඒ ඔක්කොමත් හරි. මං ඒක දන්නවා. නමුත් මේකට අහුවුනාට පස්සේ නවත්තන්න අමාරුයි’. එය එතරම් අපහසු ඇයි? එය කළ යුත්තේ ඇයි? දුම් උරන්නෝ මේ ප්‍රශ්නවලට පිළිතුරු මුළු ජීවිත කාලය පුරාවටම සොයති.

සමහරු කියා සිටින්නේ දුම් ඉරීම නැවැත්වීමට අසීරු වන්නේ නිකොටින් ශරීරයෙන් බැහැරවීමේදී ඇතිවන අපහසුතාව නිසා බවයි. ඇත්තටම නිකොටින් නිසා ඇතිවන නියම අපහසුතාව නොදැනෙන තරම් වන අතර බොහොමයක් දුම් උරන්නන් තමන් නිකොටින්වලට ඇබ්බැහිවූවෙකු බව නොදැන දිවි ගෙවති. එයින්ම ජීවිතය කෙටි වී මරණයට පත් වෙති.

දුම්වැටිය ආස්වාදජනකබව සමහරු පවසති. එය සැබෑවක්ද? එය පිළිකුල් අප්‍රියජනක දෙයකි. දුම් ඉරීමෙන් ආස්වාදයක් ලබනබව පවසන කෙනෙකුගෙන් සාමාන්‍යයෙන් පාවිච්චි කරන සිගරට් වර්ගය නොලැබුනොත් හෝ අකමැති රසයක් ඇති සිගරට් වර්ගයක් පමණක් නම් තිබෙන්නේ දුම් නොබී සිටින්නේදැයි අසන්න. කොහෙත්ම දුම් නොඋරනවාට වඩා අඩුම තරමේ දිරාගිය ලණුපටකින්වත් දුම් ඉරීම වටී. ආස්වාදය මෙතැනට අදාළ දෙයක් නොවේ. මා පොකිරිස්සන් රසය ප්‍රිය කළද කිසිදිනක උන් විස්සක් පමණ බෙල්ලේ එල්ලාගෙන නොගියෙමි. ජීවිතයේ අපි අනෙකුත් දෑ කරමින් සතුටු වන්නෙමු. නමුත් ඒවා නොකරන විට කිසිදාක යමක් අහිමි වූ හැඟීමෙන් වාඩිවී නොසිටින්නෙමු. දුම් ඉරීම ආරම්භ කිරීමට ඇති සාමාන්‍ය හේතුව නම් අප මුහුකුරා ගොස් පරිණත වී ඇති බව පෙන්වීමට ඇති කැමැත්තයි. දැන ඇනම මෙම පිළිකා දණ්ඩ භාවිත කරනවාද ඉන් මිදී නිරෝගීමත් ජීවිතයකට උරුමකම් කියනවාද යන තීරණය අන් කවරෙකු වෙත විතැන් කළ නොහැකිය.

## තීරණය ඔබ සතුයි.



**මේජර් වෛද්‍ය ධනුෂ්ක දිසානායක**
යුහ රෝහල නාරාහේන්පිට







# සුවපත් දිවියට ආයුර්වේද අත්වැල

## ගෙවත්තේ වැවෙන පැළෑටිවල ඖෂධීය ගුණ

13



කෞමදි කරුණාගොඩ මිය.
B.A.M.S (Hons) Sri Lanka, MS (Gyn & Obs) India, PhD (UOC)
විශේෂඥ වෛද්‍ය - ප්‍රසව හා නාරිවේද (ආයුර්වේද)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දේශිය වෛද්‍ය විද්‍යාතනය
කොළඹ විශ්වවිද්‍යාලය.

අතීතයේ මෙන් නිවස හා බැදුණු විශාල ගෙවත්තක් වර්තමාන ජනාකීර්ණ සමාජය තුළ දක්නට නැතත් ගහ කොළ හා මිනිසා අතර වෙන්කළ නොහැකි සබැඳියාවක් පවතී. ඒ නිසා පවතින කුඩා ඉඩක හෝ මල් පෝච්චියක වටිනා ඖෂධ පැළෑටියක් අපට සිටුවාගත හැකිය. එමගින් ගෙවත්තට අලංකාරයක් ලැබෙන අතර අත් බෙහෙතක් ලෙස යොදා ගැනිමටද හැකිවේ. එසේම අප අවට ඇති වටපිටාවට ඔක්සිජන් මුදාහැර වාතය පිරිසිදු කිරීමේ පුණ්‍ය කර්මයටද අපට දායකවිය හැකිය. එම නිසාවෙන් ගෙවත්තේ වගාකර ගත හැකි පැළෑටි කිහිපයක පවතින ඖෂධීය ගුණය පිළිබඳව කරුණු මෙම ලිපිය තුළින් සොයා බැලීමට අපේක්ෂිතය.



### ඇත්තෝර

- අර්ශස්, පණුරෝගවලට මැල්ලුමක් සේ සකසා නිතර නිතර ආහාරයට ගන්න.
- දද, කුෂ්ඨ, අසාත්ම්‍යතා, අළුහම් ආදියට බීජ ලේපය හෝ පත්‍ර යුෂ ආලේප කිරීමෙන් සුවවේ.
- පිස්සු බල්ලකු තවත් බල්ලකු සපා කෑ විට එම බල්ලාගේ නලල තෝර මුලකින් පිලිස්සීමෙන් එම බල්ලාට රෝගය නොවැළදේ යයි විශ්වාසයක් ද පවතී.

### ආඩතෝඩා

(වංඇපල, පාවට්ටා , අගල් ආදාර යනාදි නම්වලින් ද හඳුන්වයි)

- ආමවාත සන්ධි ශෝථයට තැවීමට ගනු ලබයි.
- කුෂ්ටවලට ආඩතෝඩා දළු, අමුකහ සමග අඹරා ආලේප කරන්න.
- මුත්‍රා දැවිල්ලට - පංචාංගයම තම්බා වතුර බොන්න.
- සෙම් රෝගවලට බහුලව යොදා ගන්නා වටිනා ඖෂධයකි.





### අසමෝදගම්

- ආහාර රුචිය වර්ධනය කරයි.
- බඩගින්න වඩවයි.
- හෘදය උත්තේජනය කරයි.
- සමේ රෝග නසයි.
- අජීර්ණ රෝග, පණු රෝග නසාලයි.
- ගෝනුසු විෂට අසමෝදගම් පොල් තෙලෙන් අඹරා ගෑම.
- ඇදුමට අසමෝදගම් ඇට දුම් ඇල්ලීම ඉතා ගුණදායක ය.
- සෙම් ගෙඩි, නිතර නිතර ඇතිවේ නම් අසමෝදගම් තම්බා ගත් වතුරින් උගුර සෝදන්න.

## කටුපිල



- රක්ත අර්ශස්, ව්‍රණශොථ, අණ්ඩවෘද්ධි යනාදියට ගුණයි.
- රක්තාර්ශස් රෝගයට කටුපිල කොළ, මුල් චූර්ණය මී කිරි සමඟ ගැනීම.
- යකෘත් රෝගය (ශෝථයට) කටුපිල මුල් චූර්ණය මෝරු සමඟ ගැනීම.
- අණ්ඩවෘද්ධියට මුල් චූර්ණය ජලය සමඟ
- පිළිකාවට ගසේ පංචාංගය කැඳ පිස පානය කිරීම.
- යටි පතුල්වල හටගන්නා පිළිකාවලට ගසේ පංචාංගය ලුණු දමා කොටා මලවා බැඳීම
- ගර්භාෂගත ගෙඩිවලට කටුපිල කොළ, ගස් කරල්හැබ කොළ එක පමණට ගෙන කොටා වණ්ඩුවේ තම්බා මිරිකා ගත් යුෂ මී පැණි සමඟ දීම



## අංකෙන්ද

- ආමවාතජ සන්ධි ශෝෂයට - කොළ, පොතු, ලුණුකැට, පත්තු පදමට සාදා ප්‍රලේප කිරීමෙන් ඉදිමුම හා වේදනාව නැතිවේ.
- තුවාල හා ගෙඩිවලට - කොළ පොතු මැල්ලුම සාදා බැඳීමෙන් ගෙඩිය ඉසිරී යයි.
- දරුණු තැලීම් හා අභාඝාත අවස්ථාවල දී කැඳ සාදා දීම

## බෙහෙත් අනෝදා



- යටි පතුල් පැලීමට කොළවල ඉස්ම ආලේපය
- ගෙඩිවලට, ලේ ගෙඩිවලට කොළ තලා ගෙඩිය මත ආලේප කරන්න. ගෙඩිය පිපිරී සැරව පිටවේ.
- තුවාලයට කොළ තම්බා වතුරින් සෝදන්න. පිරිසිදු වී තුවාලය සුව වෙයි.
- රක්තාර්ශස්වලට අනෝදා කොළ කැකුළුහාල් සමඟ අමුකහ අඹරා පොල් කිරෙන් උයා ආලේප කරන්න.
- අර්ශස් ගෙඩිවලට ද ඉහත ප්‍රතිකාරය ප්‍රත්‍යක්ෂ ක්‍රමයකි.



## අහු

- අජීර්ණ, අක්මාරෝග, දියවැඩියාව, වකුගඩු රෝග ආදියට ගුණයි.
- ගෙඩි, වණ වෙදකමෙහි ප්‍රධාන ඖෂධයකි.
- කොළ තලා ලබා ගන්නා යුෂ ගෙඩියේ ආලේප කිරීම.
- කොළ අඹරා ලබා ගන්නා ලේපය වණ තුවාල පිරිසිදු කර සුව කරයි.
- විදුරුමස් ශක්තිමත් කිරීමට අහු ඇට තම්බාගත් ජලයට ලුණු මිශ්‍ර කර කට සෝදන්න.
- සර්පවිෂට අහු කොළ, අමුකහ සමඟ අඹරා ආලේප කරන්න.
- බලකාරකයි. ක්ෂය රෝගයට ගුණයි.

අප අවට සුලභව දක්නට ලැබෙන බොහෝ පැළෑටි වටිනා බෙහෙත් පැළෑටි වේ. මෙවැනි ඖෂධීය ගුණයන්ගෙන් සමන්විත පැළෑටි පිළිබඳ දැනුවත්වීම මෙන්ම ඒ ඇසුරින් අපූරු ගෙවත්තක් නිර්මාණය කර ගැනීම නිරෝගිමත් සමාජයක් ගොඩ නැගීමට ඉවහල් වනු ඇත.



# සංස්කෘතිය කලාව උරුමය හා වීරත්වය

## පෙර වදනක්

වර්තමානය ඉතා දියුණු යැයි සිතමින් හා තාක්ෂණය අතින් ඉහළ තැනක සිටින බව, අතීතයේ විශ්වාස කරමින් අනාගතය වෙත ගමන් කරයි. පැවති දියුණු තාක්ෂණය තුළින් අපට උරුම වූ සියල්ල අපගේ ශක්තිය බව බොහෝ දෙනා අමතක කොට තිබේ. අද අප නවීන තාක්ෂණයෙන් සොයා ගන්නා ලද බොහෝ දේ මුතුන් මිත්තන් විසින් ඒ හා සමානව හෝ ඊටත් වඩා හොඳින් නිර්මාණය කර ඇති බවත් අතීතයේ සිදුකළ කලාත්මක හා වාස්තු විද්‍යාත්මක නිර්මාණයන් සාක්ෂි දරයි. ඒවා පුරාණ වත්මන් මෙන්ම අනාගත මනුෂ්‍ය වර්ගයාගේ සැනසීම වස් නිර්මාණය කොට ඇති බවත්, මිනිස් චෛතසිකය, ආගම, කලාව යන ත්‍රිත්වයම තුළ ගැබ්ව පවතින බවත් මෙම ලිපි මාලාව තුළින් ඔබට අවබෝධ වනු ඇත.

බෞද්ධ ජාතක කතාවන්ට අනුව ප්‍රභූ පන්තියේ හෝ සමාජයේ සුවිශේෂී පුද්ගලයන් මිය ගිය පසු ඔවුන්ගේ ශරීර කොටස් තැන්පත් කර සකසන ලද ස්තූපයන්ට සමාන ගොඩනැගිලි විශේෂයක් බුද්ධකාලීන භාරතයේ පැවති බව



තහවුරු වේ. තවද මළවුන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා ස්තූප කරවීම ශාක්‍ය වංශිකයන්ගේ සංස්කෘතික අංගයක් වූ බව දක්නට ලැබේ.

තවද මමී (කල් තබා ගැනීමට බෙහෙත් ගල්වා සකස් කරන ලද මානව සිරුරු) තැන්පත් කිරීම සඳහා නයිල් නිම්න ශිෂ්ටාචාරයේ එනම් වර්තමාන ඊජිප්තුව තුළ



නිර්මාණය කරන ලද පිරමීඩ මගින් ස්තූපයේ මුල් අවස්ථාව නිරූපණය වන බව ඇතැම් පුරාවිද්‍යාඥයන්ගේ මතයයි. කෙසේ වෙතත් ස්තූපයේ මුල් අවදිය තුළ එහි මූලික සංකල්පය වී ඇත්තේ මිය ගිය පුද්ගලයින්ගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ඔවුන් ස්මරණය සඳහා ස්මාරකයක් ඉදි කිරීමයි. එමෙන්ම බුද්ධකාලීන යුගයේද ඊට පෙර සිටද ස්මාරක සම්බන්ධ කලාවක් පැවති බව දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රය තුළද සඳහන් වේ.

බෞද්ධ ස්තූප ගොඩනැගීම ආරම්භ වන්නේ බුදුන් වහන්සේ ජීවමානව සිටි කාලය තුළදීමය. බුදුන් වහන්සේගේ අගසව් දෙනම වූ සැරියුත් හා මුගලන් මහ රහතන් වහන්සේලා පිරිනිවන් පෑමෙන් පසුව ධාතු තැන්පත් කොට ස්තූපයක් බැගින් කරවන ලද බව සුමංගලවිලාසිනියෙහි එන පරිනිබ්බාන සූත්‍ර වර්ණනාවේ සඳහන් කොට තිබේ.

ආනන්ද හිමියන් විසින් බුදුන් වහන්සේ පිරිනිවන් පෑ විට සිදුකළ යුතු දෑ විමසූ අවස්ථාවේ තමන් වහන්සේගේ දේහය සක්විති රජකෙනෙකුගේ මෘත දේහයක් හා සමාන කොට සලකා ආදාහනය කොට සිව් මංසංධියක ස්තූපයක් තනවා ප්‍රදක්ෂිණා කිරීමෙන් හා මල් පැළඳවීමෙන් පූජා කරන ලෙස දේශනා කොට තිබේ.

මීට අමතරව සර්වාස්තිවාදී විනයේ දැක්වෙන ආකාරයට අනේපිඬු සිටුතුමන්ද බුදුන් වහන්සේ ජීවමාන කාලයේම උන්වහන්සේගේ කෙස් සහ නිය ලබාගෙන එම ධාතූන් වහන්සේලා තැන්පත් කොට ස්තූපයක් තැනවීම සඳහා බුදුන් වහන්සේගේ අවසරය ලබාගෙන ඇත. එම ස්තූපයේ බිත්ති සුදු, කළු, රතු යන වර්ණයන් ආලේප කිරීමටත් මෛථුන රූප (ස්ත්‍රී පුරුෂ සංසර්ගයේ යෙදෙන රූප) හැර අනෙක් ඕනෑම සිතුවමක් ඇඳීමටත් දොරටු සවිකර ගරාදි වැට තැනීමටත් උන්වහන්සේ අවසර ලබා දුන් බව වැඩිදුරටත් සඳහන් වේ.

මහාසාංඝික විනයේ එන පරිදි කාශ්‍යප බුදුන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු කෘස නම් වූ රජ කෙනෙකු උන් වහන්සෙගේ ධාතු තැන්පත් කොට ස්තූපයක් තනවා තිබේ.



එමෙන්ම කෘස රජු එම ස්තූපයේ සිව් දිශාවෙහි මැණික් ඔබ්බවා නිර්මාණය කරන ලද බවත් එහි කැටයම් හා නොයෙකුත් චිත්‍ර කරවූ බවත් සඳහන් වේ. මෙම ග්‍රන්ථයේ සඳහන් වන ආකාරයට ධාතු තැන්පත් කොට යමක් නිර්මාණය කළහොත් ස්තූපය යන නාමයද ධාතු රහිතව ඉදිකළ විට චෛත්‍ය යන නාමයද භාවිතා කර ඇත. ගෞතම බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වී සති හතක් ගතවූ විට උන්වහන්සේ වෙත පැමිණි තපස්සු භල්ලුක වෙළඳ සහෝදරවරුන් දෙදෙනා උන්වහන්සේ විසින් ලබාදුන් කේශ ධාතූන් වහන්සේලා රැගෙන ලංකාවට පැමිණියහ.

බුදුන් වහන්සේ විසින් ඔවුන්ට කේෂ ධාතු ලබා දීමේදී මෙම ධාතූන් කවර ආකාරයේ නිර්මාණයක් තුළ තැන්පත් කරන්නේද යන්න විමසූවිට සඟල සිවුර කොටස් කිහිපයකට නවා ඒ මත ධාතූන් වහන්සේලා තබා කේශ ධාතූන් සිය පාත්‍රයෙන් වසා පාත්‍රයට උඩින් සැරයටිය තබා තැන්පත් කළ යුතු බව දක්වා තිබේ. මෙය ලෝකය තුළ බිහිවූ ශ්‍රේෂ්ඨතම ගෘහ නිර්මාණ ශිල්පියා බුදුන් වහන්සේ බව සනාථ කරමින් අපට දැක්වූ ස්තූපයේ ආකෘතියයි. ලක්දිව නිර්මාණය කරන ලද ප්‍රථම ස්තූපය වන ගිරිහඬු සෑය මේවන විට සංරක්ෂණය කර තිරියාය ප්‍රදේශයේ දැක ගත හැකිය. එමෙන්ම බුදුන් වහන්සේ මහියංගනයට වැඩම කළ අවස්ථාවේ සුමන නැමැති (පසු කාලීනව සුමන සමන් දෙවියන්) පරුමකයා විසින් බුදුන් වහන්සේගේ කේශ ධාතු තැන්පත් කොට මහියංගන දාගැබ කරවා තිබේ. එමෙන්ම පසුකාලීනව මහින්දාගමනයෙන් පසු දේවානම්පියතිස්ස රජු විසින් ථූපාරාම දාගැබ නිර්මාණය කර ඇත.

බුදුදහම තුළ පමණක් නොව ජෛන දහම තුළද ස්තූප නිර්මාණය කළ බවට සාධක හමුවී තිබේ. විශේෂයෙන් ජෛන මහා වීරයන් මරණයෙන් පසු ඔහුගේ නෂ්ටාවශේෂ තැන්පත් කර ස්තූපයක් කොට තිබේ. ඉන්දියාව තුළ අශෝක අධිරාජ්‍යයාගේ සහ කණිෂ්ක රජුගේ රාජ්‍ය කාලසීමාවන් තුළදී ස්තූප නිර්මාණය සඳහා මෙන්ම ස්තූප ප්‍රතිසංස්කරණය සඳහාද විශේෂ ස්ථානයක් ලැබී තිබේ. බොහෝ පාලකයෝ ස්තූප නිර්මාණය හා ප්‍රතිසංස්කරණය කිරීම නිරෝගීබව දීර්ඝායුෂ හිමිවන පිනක් බව විශ්වාස කළහ.



කෙසේ වුවත් ස්තූප යන සංකල්පය බෞද්ධ පදනමක් මත ඉන්දියාව තුළ වඩාත් ප්‍රචලිත වූවත් වෙනත් නිර්මාණයන් තුළද මීට සමාන ලක්ෂණ සහිත ගොඩනැගිලි දක්නට ලැබේ. උදාහරණ ලෙස සුමේරියානු ශිෂ්ටාචාරයේ චන්ද්‍ර, වායු යන දෙවිවරුන්ගේ ඇදහීම සඳහා “ශිගුරන්” යනුවෙන් හැඳින්වෙන දාගැබ්වලට සමාන ගොඩනැගිලි විශේෂයක් දක්නට ලැබේ. එහි කාලනිර්ණය අනුව ක්‍රි:පූ 539 පමණ කාලසීමාවකට අයත් වේ. එසේ බලන විට ඉන්දියානු ස්තූපයන්ට වඩා සපොතේමියානු ශිෂ්ටාචාරයේ “ශිගුරන්” දාගැබ වඩා පැරණි විය හැකි බව පෙනේ . එසේ නම් අපට පැහැදිලි වන්නේ ස්තූප නම් වාස්තු විද්‍යාත්මක අංගය වසර දහස් ගණනකට පෙර සිට පැවත එන පෙර අපර දෙදිගටම පොදු උරුමයක් වූ බවයි.



**කථිකාචාර්ය රන්දුනු විදුල සොයිසා**
MBA (Gloustershira - UK)
BA (SP) (Usjp)
Post Graduate Dip in Tourism & Hospitality Management (Othm)

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Colonel (Logistics)
HQ SLAVF
Colonel
MAV Gunarathna
USP ato



Colonel General Staff
HQ SLAVF
Colonel
HHSPS De Silva RSP USP



Commanding Officer
HQ SLAVF
Lieutenant Colonel
HMA Pushpakumara



SO I (Welfare)
HQ SLAVF
Lieutenant Colonel
AANB Athurugiri RSP



SO I (Admin)
HQ SLAVF
Lieutenant Colonel
HMLB Samarakoon



Commanding Officer
17(V) SLSR
Major
GWASL De Alwis



Commanding Officer
8 SLNG
Major
EDSK Deniyaya



Commanding Officer
11 SLNG
Major
HPC Hettiarachchi



Commanding Officer
5 (V) SLLI
Major
UMTC Dharmasiri RWP



Commanding Officer
5 (V) GR
Major
DSYL Kuruwita



Commanding Officer
14 SLNG
Major
SS Vijethunga



Commanding Officer
15 (V) SLSR
Major
AMDS Thilakarathne

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



2 nd In Command
1 SLNG
Major
MSK Perera



SO II Legal
HQ SLAVF
Major
HSD  Mendis



2 nd In Command
3 (V) GW
Major
RDWUB Ranwala psc



SO II (Coord)
HQ SLAVF
Major
MMP Danuska



2 nd In Command
1 (V) SLRC
Major
HMNAB Herath



SO II (Admin)
HQ SLAVF
Major
KMWMTD Wijekoon



SO II (Asst Account)
HQ SLAVF
Captain
ADW Gamage



SO III (Logistics)
HQ SLAVF
Captain
PCK Ranaweera



Adjutant
3 (V) SLSR
Captain
PPCR Patabandige



Adjutant
17 (V) GR
Lieutenant
JM Kalansooriya



Adjutant
14 SLNG
Lieutenant
WMCM Senevirathne



Int Officer
1 (V) SLRC
Lieutenant
MT Chandrasena

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Chief Clerk
Log Branch - HQ SLAVF
WO I
MBIL Karunarathna USP



Regmental
Sergent Major
3 SLNG
WO I RPNM Wijethunga



Regmental
Sergent Major
5 SLNG
WO I RP Payadasa



Regmental
Sergent Major
16 SLNG
WO I PATP Ramanayaka



Regmental
Sergent Major
17 SLNG
WO I KGN Roshan



Chief Clerk
Legal Section - HQ SLAVF
S/SGT Premarathna RDS



Drill Instructor
Log Comd
S/SGT Hettiarachchi HT



Chief Clerk
17 (V) VIR
S/SGT Bandara KVTRR



Chief Clerk
8 SLNG
S/SGT Kumara RMTP




Chief Clerk
2 (V) GR
S/SGT Wanasingha WKCG




Chief Clerk
3 (V) SLSR
Sgt Kumara HTRK



Chief Clerk
11 (V) SLSR
Sgt Bandara GKS



# විරු උක්ෂමාචාර

## 40 වන කලාපයේ සිට ගෙනඑන විරු පදක්කම් ....



දේශ පුත්‍ර සම්මානය

යම් සතුරු ක්‍රියාවකින් හෝ මෙහෙයුමකින් තුවාල ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද, නාවික සහ ගුවන් හමුදාවේ සියලුම නිලයන් සඳහා මෙම පදක්කම පිරිනමනු ලබයි. එවැනි තුවාල 'මධ්‍යස්ථ හෝ දරුණු' තුවාල ලෙස වෛද්‍ය මතය අනුව වර්ගීකරණය කරන ලබනු අතර, මෙම පදක්කම හිමිගැන්වීම සඳහා අවශ්‍ය නිර්දේශය යුද හමුදාපති, නාවික හමුදාපති හෝ ගුවන් හමුදාපති විසින් සිදු කරනු ලබයි.



නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම

ආරක්ෂක අමාත්‍ය, ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ආරක්ෂක ලේකම්, සේවා අණදෙන නිලධාරීන්, පොලිස්පති ආදී සක්‍රීය සේවයේ නියුතු සියලුම නිලධාරීන් සහ සිවිල් වෛද්‍යවරුන් ද ඔවුන්ගේ කාර්ය මණ්ඩලය, පොලිස් නිලධාරීන් සිවිල් වැසියන් යන අයට මෙම පදක්කම පිරිනැමිය යුතු බව නියම කර ඇත. 2006 ජූලි 28 සිට 2007 ජූලි 10 දක්වා කාලය තුළ සන්නද්ධ සේවාවන්හි සේවයේ යොදවා ඇත්තා වු ද නැගෙනහිර මානුෂීය මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරිව සහභාගී වු ද අයවළුන් සඳහා මෙම පදක්කම හිමිගන්වනු ලබයි.

# ප්‍රහේලිකාව

## 14

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 බු | | | 2 ර | | ■ | 3 ස | |
| | ■ | ■ | | ■ | ■ | | ■ |
| 4 තා | 5 | ■ | 6 ප | | | නි | ■ |
| ■ | එ | ■ | | ■ | ■ | ■ | 7 ස් |
| 8 භ | ■ | 9 නු | | 10 ර | ■ | 11 ගා | |
| | ■ | | ■ | 12 | භී | ■ | |
| | ■ | ■ | ■ | | ■ | ■ | බු |
| 13 ක | | | ලි | | ■ | 14 පු | |

### හරහට

1 විද්‍යාචක්‍රවර්තීන් විසින් රචිත ප්‍රසිද්ධ ගද්‍ය කෘතියකි.
3 සත්වයා යන අරුත් දෙන පදයකි.
4 මාතා යන පදයට දමිළ බසින් භාවිත වන වචනයකි.
6 හින්දු දේව ඇදහිලි අතර සිටින දේවතාවියකි.
9 යුනෙස්කෝව විසින් නම් කළ මධ්‍යම පලාතේ පිහිටි ලෝක උරුම නගරයකි.
11 බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන ධම්මපදය ------ වලින් සමන්විතය.
12 මහපොළව මෙසේද හඳුන්වයි.
13 ශ්‍රී ලංකාවේ දකුණු පලාතේ පිහිටි ආවේණික ශාක හා සත්ව විශේෂ සහිත ජෛව රක්ෂිතයකි.
14 පිපුණු යන අදහස දෙයි.

### පහළට

1 සොරබොර වැව ඉදිකර ඇති දුටුගැමුණු රජුගේ යෝධයා වේ.
2 වැවක වැව් බැම්මේ ආරක්ෂාවට ඉදිකළ අංගයකි.
3 පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම විශේෂයකි.
5 ---- සහිත වචන සිංහල ලේඛන ව්‍යවහාරයේ එතරම් සුලබ නොවේ.
7 සංස්කෘතිකමය වටිනාකමක් සහිත තුර්කියේ නගරයකි.
8 ශාසන ඉතිහාසයට අනුව ප්‍රථම දේවාචික උපාසකවරුන් අතරින් කෙනෙකි.
9 ඇගේ --- බැල්ම ඔහු වසඟයට ගත්තේය.
10 සිත් ඇදගන්නාබවට කියන වෙනත් වචනයකි.



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
පාසෙ සිල්වා එල්එච්එල්ඩී 10 (සෙවි) විපාරෙ
හා වෙනුරි දිලක්ෂි මෙනවිය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
සැරයන් පතිරාජ පීඅයිඩී 2 (සෙවි) ශ්‍රීලයුපොදුසේබ
හා නුවන් චතුරංග මහතා

# යුග දිවියට සුබ පැතුම්



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
ලා/කෝ විජේසිංහ එන්පීඑච්එස් 17 (සෙවි) ගරෙ
හා මධුශානි සුදේශිකා මෙනවිය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
ලා/කෝ සම්පත් පීකේඩීයූ 2 ශ්‍රීලංජාආබමු
හා උදාරි ඉන්දිකා මෙනවිය






පළමුවන වියට පා තැබූ
පියවි සෙහන්ෂි දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් ධනංජය සිල්වා ඒඩී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
බිනුලයා දිව්‍යාධි දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ සෝමරත්න අයිපීඑල්
පියා සහ මව
ඇතුළු පවුලේ සැම



පස්වන වියට පා තැබූ
මිතුජ ආදිත්‍ය පුතුට
සු'පැතුම් පතන්නේ
සැරයන් රෝෂිණී ඒඒආර්
මව සහ පියා
ඇතුළු පවුලේ සැම



දෙවන වියට පා තැබූ
අහස්නා සේමින්දි දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ තෙවරප්පෙරුම අයියු
පියා සහ මව
ඇතුළු පවුලේ සැම



හත්වන වියට පා තැබූ
යසඳ දම්සිත් පුතුට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ රණසිංහ ආර්ඒපීඑස්
පියා සහ මව
ඇතුළු පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
සනුල දින්සර පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් සම්පත් ඩීඑම් පියා
සහ මව ඇතුළු
පවුලේ සැම



තෙවන වියට පා තැබූ
ජිතුම් දිල්ෂාර පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් උපතිස්ස ජීආර් පියා
සහ මව ඇතුළු
පවුලේ සැම



හතර වන වියට පා තැබූ
ශනුන්‍යා අභිලාෂි දියණියට
සු'පැතුම් පතන්නේ ලා/කෝ
කුරුකුලසූරිය කේඑස්එම්පී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



පස්වන වියට පා තැබූ
යසිදු හිමහන්ස පුතුට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ මදුශංක ඒඩීසී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



අටවන වියට පා තැබූ
ගනුලි මෙතුම්සා දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් මලලසේකර ඩීඑම්ඒබී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
රිෂිනි දිහංසා දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් ප්‍රියදර්ශන කේඒආර්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
සෙනුකී තිහිංසා දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් වීරරත්න අයිපීසීකේ
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
මිහිංස විද්වාන් පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් රූපසිංහ ආර්ඒඩීපී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



නවවන වියට පා තැබූ
තරූෂ සෙනෙහස් පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් තිලකසිරි පීජීඩබ්ලිව්
අයියූ පියා සහ මව ඇතුළු
පවුලේ සැම



එකොළොස් වන වියට පා තැබූ
මනීෂා සදකිනි දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් තිලකසිරි පීජීඩබ්ලිව්
අයියූ පියා සහ මව ඇතුළු
පවුලේ සැම



එකොළොස් වන වියට පා තැබූ
සචිනි චමෝදි දියණියට
සු'පැතුම් පතන්නේ
බනි II ගුණරත්න එච්එම්ජීඒකේ
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



හයවන වියට පා තැබූ
සිතු සනායා දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ ලහිරු ඩීඑම්එන්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



හතරවන වියට පා තැබූ
ඉදුරංග හේමාල් පුතුට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ ලහිරු ඩීඑම්එන්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



පස්වන වියට පා තැබූ
ඉදූෂ උපේක්ෂ පුතුට සු'පැතුම්
පතන්නේ
ලා/කෝ හෙට්ටිආරච්චි
එච්ඒඑච්ර් පියා සහ මව
ඇතුළු පවුලේ සැම




තෙවන වියට පා තැබූ
යෙනුල් නිම්සර පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් කීර්තිරත්න
ඒඑච්ටීඑස්එස් පියා සහ මව
ඇතුළු පවුලේ සැම



# කඳවුරම ප්‍රේක්ෂකාගාරයක් කළ

## අන්තර් ආයතන ක්‍රිකට් ශූරතාවලිය 2023



තරඟාවලියේ ශූරයන් වූ ප්‍රධාන ශාඛා කණ්ඩායම





තරඟාවලියේ අනුශූරයන් වූ මූලස්ථාන බළඇණි කණ්ඩායම